


# මහජන බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා අදාල සාමාන්‍ය කොන්දේසි හා නියමයන්

PEOPLE'S BANK

Pride of the Nation

**මෙම ලේඛණයේ සිංහල භාෂා පරිවර්තනයෙහි පිටපතක් ඔබට අවශ්‍ය වේ නම්, කරුණාකාර අපගේ වෙබ් අඩවිය වන www.peoplesbank.lk වෙත පිවිසෙන්න.**

இந்த ஆவணத்தின் தமிழ் மொழிபெயர்ப்பு உங்களுக்குத் தேவைப்படின், தயவுசெய்து **www.peoplesbank.lk** என்ற எமது இணையத்தளத்திற்கு பிரவேசிக்கவும்.

Should you require a translated copy of this document in Sinhala or Tamil, please visit **www.peoplesbank.lk**

# කාඩ්හිමිකාර ගිවිසුම නියමයන් හා කොන්දේසි

මම/අපි මෙයින් එකඟ වනුයේ මගේ/අපගේ කාඩ්පත/ත් මහජන බැංකු සංශෝධිත පනත අංක 1961 අංක 29 යටතේ ස්ථාපිත කර ඇති බැංකු සංස්ථාවක්වූ මහජන බැංකුව විසින් නිකුත් කර ඇති බවත්ම එම බැංකුවේ ප්‍රධාන කාර්යාලය ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 02, චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතේ, අංක 75 හේ පිහිටුවා තිබෙන බවත් තවදුරටත් පවසන්නේ මා/අප විසින් පහතින් දක්වා ඇති නියමයන් හා කොන්දේසි පිළිබඳව එකඟවන බවත්ය.

**1. නිර්වචන**

1.1. "ATM" යනු ස්වයංක්‍රීය ගණක යන්ත්‍රය නොහොත් බැංකුවට අයත් හෝ ඕනෑම කාඩ්පත් ක්‍රියාකරවන යන්ත්‍රයක් නොහොත් උපකරණයක් වන අතර එය කලින් කලට බැංකුව විසින් නම්කළ වෙනත් බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට අයත්ව කාඩ්පත් භාරගැනීම සිදුකළ හැකිවනු ඇත.

1.2. "අයදුම්කරු" වනුයේ කාඩ් අයදුම්පත අත්සන් කළ පුද්ගලයාය.

1.3. "බැංකුව" යනු මහජන බැංකුව, එහි අනුප්‍රාප්තිකයින් හා පැවරුම්ලද්දන්ය.

1.4. "කාඩ්පත" යනු බැංකුව විසින් කාඩ්පත දරන්නා වෙත නිකුත් කර ඇති ගෙවීම් කාඩ්පත වන අතර ඊට මූලික, අතිරේක හා ප්‍රතිසම්පාදන කාඩ්පතද ඇතුළත් වේ.

1.5. "කාඩ් ගිණුම" යනු බැංකුව විසින් කාඩ් ගනුදෙනුව සඳහා පවත්වාගෙන යන ගිණුම වේ.

1.6. "කාඩ් මධ්‍යස්ථානය" යනු මහජන බැංකුවේ ණය කාඩ් මධ්‍යස්ථානය වේ.

1.7. "කාඩ් හිමියා" යනු තමා නමින් බැංකුවේ කාඩ් පත්‍රය නිකුත් කර ඇති පුද්ගලයා වන අතර කාඩ් පත්‍රයට අදාළ ගිවිසුමද ඔහු/ඇය විසින් අත්සන් කර ඇති අතර කාඩ් ගිණුමේ සියලු ගනුදෙනුවලට ඔහු වගකිවයුතු වේ.

1.8. "කාඩ් ගනුදෙනු" යනු කාඩ්පත භාවිතයෙන් නැතහොත් කාඩ්පත් හිමියා කාඩ් ගිණුම හා කාඩ් අංකය හෝ පුද්ගලික හැඳුනුම් අංකය නැතහොත් වෙනත් ආකාරයකින් තැපැල් දුරකථන ඇණවුම්, අන්තර්ජාල, කාඩ්පත්හිමියා බලය දුන් වෙන්කර ගැනීම් වන අතර කාඩ්පත් හිමියාගේ අනුදැනුමකින් තොරව සිදුවිය හැකි ගෙවීම්ද ඊට ඇතුළත් වේ. මුදල් අත්තිකාරම්, භාණ්ඩ හා සේවා සඳහා කළ ගෙවීම්ද ඇතුළත් වේ.

1.9. "මුදල් අත්තිකාරම" යනු කාඩ්පත, කාඩ්පත් අංකය හෝ කාඩ්පතේ රහස්‍ය අංකය භාවිතයෙන් මුදල් ලබා ගැනීම වේ. එය කාඩ්පත් හිමියා විසින් බැංකුවෙන්, වෙනත් බැංකුවකින් හෝ මූල්‍ය ආයතනයකින් මුදල් ලබා ගැනීම වන අතර එකී ප්‍රමාණය කාඩ්පත් ගිණුමෙන් හා පවත්නා කාඩ්පත් ශේෂයෙන් හර කෙරෙනු ඇත.

1.10. "ගාස්තු" යනු කාඩ්පත් දරන්නා විසින් කාඩ්පත හෝ කාඩ් අංකය හෝ පුද්ගලික අංකය හෝ එම නියමයන් හා කොන්දේසි යටතේ ගෙවිය යුතු ප්‍රමාණයක් වන අතර සීමාවක් නොමැතිව සියලු කාඩ්පත් ගනුදෙනු ගාස්තු පොලී, බදු, අමතර වියදම්, හානි/පාඩු නෛතික වියදම්, විය පැහැදම් වන අතර එකී මුදල් කාඩ්පත් ගිණුමට හර කරනු ඇත. එකී ප්‍රවර්තන ශේෂයෙන්ද හර කෙරෙනු ඇත.

1.11. "ආයතනික කාඩ්පත" යනු සුදුසුකම් ඇති ආයතන සංවිධානයක් විසින් තම කාර්ය මණ්ඩලය, විධායකයන්, අධ්‍යක්ෂවරුන් හෝ වෙනත් බලාත්මක කළ වෙනත් පුද්ගලයන් වෙත ලබාදෙන කාඩ්පත් වේ.

1.12. "ණය සීමාව" යනු ප්‍රාථමික හා අතිරේක කාඩ්පත් සඳහා බැංකුව විසින් කාඩ්පත් ගිණුම සඳහා අවසර දී ඇති උපරිම හර ශේෂය වේ. මෙකී උපරිම හර ශේෂය විටින් විට ප්‍රාථමික කාඩ්පත් හිමිකරු වෙත බැංකුව විසින් දන්වනු ලැබේ.

1.13. “ප්‍රවර්තන ශේෂය” යනු පූර්ණ ණය ශේෂය වන අතර එය කාඩ්පත් ගිණුමේ නොගෙවූ මෙන්ම බැංකුවේ වාර්තා අනුව ගිණුම් ප්‍රකාශය නිකුත් කළ දිනයේදී බැංකුවට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය වේ. මෙකී ශේෂයට කාඩ්පත් ගනුදෙනු,පොළිය, ගාස්තු, වියදම්, පිරිවැය, අයබදු, නෛතික වියදම් ද ඇතුළත් වේ.

1.14. “තැන්පතුව” යනු කාඩ්පත් ක්‍රියාකරුගේ කාර්යඑලය සඳහා සුරැකුමක් ලෙස බැංකුවේ තැන්පත් කර ඇති මුදල් ප්‍රමාණයකි.

1.15. “සමූහ සාමාජික” යනු බැංකුවේ සහයක සමාගමක් හෝ උප සමාගමක් වේ.

1.16. “ඇපකරය” යනු කාඩ්පත්හිමියාගේ නමට කාඩ්පතක් නිකුත් කිරීමේදී ඔහුගේ එකී කාඩ්පතේ විශේෂිත කරනු ලබන මුදල් ප්‍රමාණය කරනු ලබන බන්ධනයට අනුව කෙරෙන කාර්ය ඵලයන්ට සුරක්ෂාවක් සැපයිය හැකි බැංකුවක් ආයතනයක් හාර සංයුක්ත ව්‍යාපාර සංවිධානයක පුද්ගලයෙක් හෝ, නැතහොත් පුද්ගලයෙකි.

1.17. “මුද්‍රිකය (Imprinter)” යනු කාඩ්පත් ගනුදෙනු සම්බන්ධව අතින් ක්‍රියාත්මක කළ හැකි උපකරණයකි.

1.18. “අන්තර් ක්‍රියාකාරික හඬ ප්‍රතිචාරක පද්ධතිය (Interactive Voice Response (IVR) System)” යනුවෙන් හැඳින්වෙනුයේ කාඩ්පත් හිමියාට තම කාඩ්පත භාවිතයෙන් කාඩ්පත් ගිණුම හා අදාළ සේවාවන් සම්බන්ධව විස්තර ලබා ගැනීම සඳහා භාවිතා කළ හැකි උපකරණයක් වන අතර එමගින් එකී සේවාවන් සඳහා ඉලෙක්ට්‍රොනික ප්‍රවේශයක් ලබාගත හැකි වේ.

1.19. “වෙළෙන්දා” යනු කාඩ්පත් හිමියාට කාඩ්පත හෝ කාඩ්පත් අංකය භාරගෙන භාණ්ඩ හෝ සේවාවන් විකිණීම සඳහා බැංකු විසින් පිළිගෙන ඇති සංයුක්ත ඒකකයක්, ආයතනයක් හෝ පුද්ගලයෙක් වේ.

1.20. “ගෙවිය යුතු අවම ප්‍රමාණය” යනු ගෙවීමට නියමිත දිනයේදී ගෙවා දැමීමෙන් ප්‍රමාද ගෙවීම් ගාස්තු ගෙවීමකින් තොරව ගෙවිය හැකි ජංගම ශේෂයේ ප්‍රතිශතයකි.

1.21. “මාසය” යනු ලිත් මාසයකි.

1.22. “කල් ඉක්මවුණු ප්‍රමාණය” යනු කාඩ්පත් හිමියාගේ පෙර ගිණුම් ප්‍රකාශයෙන් නොගෙවා ඉදිරියට ගෙන එනු ලබන ප්‍රමාණය වේ. තමාගේ ගිණුම් ප්‍රකාශයේ ගෙවිය යුතු අවම ප්‍රමාණය එයට ඇතුළත් වන අතර එය සැණෙකින් ගෙවා දැමිය යුතුවේ.

1.23 “අධි සීමා මුදල” යනු ණය සීමාව ප්‍රවර්තන ශේෂය ඉක්මවා යෑමෙන් සෑදේ.

1.24. “අධි සීමා ගාස්තු” යනු කාඩ්පත් හිමියා තමන්ගේ ණය සීමාව ඉක්මවූ විට ගිණුම් ප්‍රකාශයකට ගෙවිය යුතු අමතර ගාස්තුවයි.

1.25. “ගෙවීම කළ යුතු නියමිත දිනය” යනු ගිණුම් ප්‍රකාශයේ දක්වා ඇති ජංගම ශේෂය හෝ ඉන් කොටසක් හෝ බැංකුවට ගෙවිය යුතු ප්‍රවර්තන ශේෂයෙන් අවම ප්‍රමාණය ගෙවිය යුතු දිනය වේ.

1.26. රහස්‍ය අංකය (PIN) යනු කාඩ්පත් හිමියා වෙත බැංකුව මගින් ලබාදී ඇති පුද්ගලයා හඳුනාගැනීමේ අංකය වන අතර එමගින් කාඩ්පත් හිමියාට ඉලෙක්ට්‍රොනිකව ATM/POS යන්ත්‍රයකින් තම ගනුදෙනු කළ හැකිය.

1.27. “POS” යනු විකුණුම් කරන ස්ථානයක ස්ථාපිත කර ඇති උපකරණයක් වන අතර එමගින් කාඩ්පත් ගනුදෙනු ඉලෙක්ට්‍රොනිකව කර ගත හැකි වේ.

1.28. “මූලික කාඩ්පත් හිමියා” යනු බැංකුව විසින් පළමුව පරිපූරක කාඩ්පත්වලට අමතරව මූලික ප්‍රධාන කාඩ්පත නිකුත් කර ඇති පුද්ගලයා වේ. එයින් ඇතිවන ගිණුම බැංකුව විසින් විවෘත කර පවත්වාගෙන යනු ලැබේ.

1.29. “Rs” “LKR” යනු ශ්‍රී ලංකා රුපියල්ය.

1.30. “සුරැකුම” යනු කාඩ්පත් හිමියාගේ බැඳීම් හා/හෝ කාඩ්පත නිකුත් කිරීමත් කාඩ්පත් හිමියාගේ කාඩ්පත් සඳහා කාර්යඵලය සම්බන්ධයෙන් වූ සුරැකීම වශයෙන් ලබාදී ඇති තැන්පතුව හෝ ඇපකරු වේ.

1.31. “කාඩ්පත් මාසික ගිණුම් ප්‍රකාශය” යනු බැංකුවෙන් මාසිකව කාඩ්පත් හිමියා වෙත එවනු ලබන ගිණුම් ප්‍රකාශය වන අතර එහි බැංකුව වෙත ගෙවිය යුතු වත්මන්/ප්‍රවර්තන ශේෂ පිළිබඳ විස්තරය දක්වා ඇත.

1.32. “ප්‍රකාශයේ දිනය” යනු බිල්පත් චක්‍රයේ අවසන් දිනය වන අතර එය කාඩ්පත් හිමියාගේ මාසික ප්‍රකාශය යොමු වන අතර අදාළ දිනයේ ව්‍යාපාර කටයුතු අවසන්වන වේලාව දක්වා සිදුවූ ගනුදෙනු ඇතුළත් වේ.

1.33. “අතිරේක කාඩ්පත” යනු මූලික කාඩ්පත් හිමියාගේ ඉල්ලීම මත නම් කර ඇති තෙවැනි පාර්ශ්වයකට බැංකුව විසින් නිකුත් කර ඇති කාඩ්පතකි. මෙකී තෙවැනි පාර්ශ්වයද බැංකුව සමග ගිවිසුමකට එළැඹිය යුතුය.

1.34. “අතිරේක කාඩ්පත් හිමියා” යනු අතිරේක කාඩ්පතක් නිකුත් කර ඇති පුද්ගලයෙකි.

1.35. “පර්යන්තය (Terminal)” යනු කාඩ්පත් ගනුදෙනු විද්‍යුත්ව කළ හැකි ස්වයංක්‍රීය (ATM) යන්ත්‍ර, ගිණුම් මධ්‍යස්ථාන (POS), KIOSK හෝ අන්තර්ජාල බැංකු කටයුතු හෝ ජංගම බැංකු කටයුතු විද්‍යුත්ව කළහැකි ස්ථාන වේ.

1.36. “ගනුදෙනු කළ දිනය” යනු කාඩ්පත් හිමියා හා වෙළෙන්දා අතර ගනුදෙනුව සිදුවූ දිනය වේ.

1.37. “ගනුදෙනු ක්‍රියාකාරකම තහවුරු දිනය” යනු කාඩ්පත් ගනුදෙනුව කාඩ්පතට ඇතුළත් කළ දිනය වේ.

1.38. “උපයෝගිතා” යනු උපයෝගිතා, භාණ්ඩ හා සේවාවන් සපයන එහෙත් ජලය, විදුලිය හා සන්නිවේදන සේවාවන්ට සීමා නොවූ ඕනෑම අධිකාරියක් හෝ ආයතනයක් වේ.

1.39. “ඒකාබද්ධ ණය සීමාව” යනු කාඩ්පත් හිමියා විසින් පවත්වාගෙන යන සියලුම කාඩ්පත් ගිණුම්වලට අදාළව කලින් කල බැංකුව විසින් නියම කරන සීමාව වේ.

**2. කාඩ්පත**

2.1. කාඩ්පත බැංකුවේ දේපළක් වන අතර බැංකුව විසින් කරන ඉල්ලීමකින් අනතුරුව ක්ෂණිකව බැංකුවට ආපසු භාර දිය යුතුවේ.

2.2. කාඩ්පත කෙසේ හෝ අන් අයෙකුට පවරා දිය නොහැකිය. එය කාඩ්පත් හිමියා පමණක් භාවිතා කළ යුතුය. කිසිදු අවස්ථාවක කාඩ්පත් හිමියා කාඩ්පත හා/හෝ රහස්‍ය අංකය (PIN) වෙනත් පුද්ගලයෙකුගේ භාවිතයට ලබා නොදිය යුතුය. කාඩ් හිමියා ඇපයක් ලෙස කාඩ්පත භාර නොදිය යුතුය.

2.3. බැංකුවට තම පූර්ණ අභිමතය භාවිතා කරමින් පෙර දැනුම්දීමකින් හෝ හේතුවකින් තොරව ඕනෑම අවස්ථාවක කාඩ්පත් මෙන්ම කාඩ්පත් හිමියාගේ කාඩ්පත භාවිතා කිරීමට ඇති අයිතිය ද කාඩ් ගනුදෙනුවලට අවසර දීමේ අයිතියද අස්කරගත හැකිය.

2.4. බැංකුව තම පූර්ණ අභිමතය භාවිතා කරමින් කාඩ්පත නැවත නිකුත් කිරීම, අලුත් කිරීම, හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීම මෙන්ම එසේ කිරීමට ප්‍රතික්ෂේප කිරීමද කළ හැකිය.

2.5. කාඩ්පත් හිමියා සෑමවිටම තම කාඩ්පත ඉතා සුරක්ෂිත ස්ථානයක තැබිය යුතුය.

**3. කාඩ්පත භාරදීම හා භාවිතය**

3.1. කාඩ්පත කාඩ්පත් හිමියා විසින් බැංකුවට පැමිණ භාරගැනීම හෝ බැංකුව වෙත ලබා දී ඇති ලිපිනයට තැපෑලෙන් හෝ කූරියර් සේවා මගින් ගෙන්වා ගැනීමට හෝ තමන්ගේ අවදානම මත තෙවන පාර්ශ්වයකට ලබා දෙන ලෙසද බැංකුවට දැන්විය හැකිය.

3.2. කාඩ්පත ලැබුනු විගස, කාඩ්පත් හිමියා කාඩ්පත පසුපිටෙහි නියමිත ස්ථානයේ තමන්ගේ අත්සන තැබිය යුතුවේ. එසේ අත්සන් තැබීම හා/ හෝ සක්‍රිය කිරීම මගින් කාඩ්පත් හිමියා ගිවිසුමේ අඩංගු නියමයන් හා කොන්දේසි පිළිගැනීමේ අවසාන සාක්ෂියද වේ.

3.3. කාඩ්පත් හිමියා එම නියමයන් හා කොන්දේසි මගින් තමන් බැඳ තැබීමට බලාපොරොත්තු නොවන්නේ කාඩ්පත දෙකට කපා එසේ කැපූ කොටස් දෙකම බැංකුවට භාරදිය යුතු අතර එසේ කිරීමෙන් ඡේද 19 (අවසන් කිරීම) සිදුවනු ඇත.

3.4. කාඩ්පත භාවිතයේදී ගිවිසුමේ සියලු නියමයන්ට එය යටත් වනු ඇත.

3.5. කාඩ්පත භාවිතා කළ හැක්කේ ණය සීමාව තුළ පමණි.

3.6. විටින් විට බැංකුව විසින් ප්‍රකාශයට පත්කරනු ලබන පහසුකම් හා ප්‍රතිලාභ කාඩ්පත් හිමියාට උපයෝගී කර ගත හැකිය.

3.7. කාඩ්පතෙහි මුද්‍රණය කර ඇති වලංගු කාලය තුළ පෙර දැනුම් දීමකින් තොරව ඕනෑම අවස්ථාවක කාඩ්පත භාවිතය සඳහා ඇති අයිතිය නවත්වා දමා කාඩ්පත් ගනුදෙනු සඳහා අවසර දීමද නවත්වා දැමිය හැකිය.

3.8. කාඩ්පත්හිමියා විසින් මෙම කාඩ්පත ප්‍රාග්ධන ගනුදෙනු හෝ වාණිජ මට්ටමෙන් භාණ්ඩ ආනයනය කිරීම සඳහා භාවිතා නොකළ යුතුය.

3.9. කාඩ්පත ශ්‍රී ලංකාවෙන් පිටතදී භාවිත කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව, විනිමය පාලන දෙපාර්තමේන්තුව හෝ වෙනත් නියාමන ආයතන මගින් විටින් විට නියාමන ලබාදෙනු ඇත. එමෙන්ම ගෙවිය යුතු ප්‍රමාණයන්ගෙන් තමන්ගේ අයිතීන්, ප්‍රතිකර්ම හෝ අධිකරණ, ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් නියාමන ආයතනයන් තමන්ට එරෙහිව නගන ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන ආකාරයට ගෙවා දමා නිදහස් කරගත යුතුය.

3.10. කාඩ්පත කාඩ්පතේ මුද්‍රාපිත කාලය අවසන්වන දිනය දක්වා, එහි අවසන් දිනය දක්වා කාඩ්පතේ ගිණුමේ තත්වය වලංගු වන සේ භාවිතා කළ හැකිය.

3.11. කාඩ්පත හා බැංකුව සම්බන්ධ සියලු ගනුදෙනු සෑම විටම සාධු සිතින් සිදුකිරීමට කාඩ් හිමියා පොරොන්දු විය යුතුය.

3.12. කාඩ්පත්හිමියා කාඩ්පත නීතිවිරෝධී ක්‍රියාවන්හි නොයෙදිය යුතුයි.

**4. ණය සීමාව හා ඒකාබද්ධ ණය සීමාවන්**

4.1. (a) බැංකුව විසින් කාඩ්පත් ගිණුම සඳහා ණය සීමාවන් නියම කරනු ලබන අතර එය තරයේ පිළිපැදිය යුතුවේ. එසේ වුවද කාඩ්පත් හිමියාට විටින් විට ණය සීමාව සමාලෝචනය කරන ලෙස ඉල්ලීම් කළ හැකිය.

(b) ණය සීමාව ඉක්මවා ගොස් ඇත්දැයි ගණන් බැලීමේදී බැංකුව විසින් එතෙක් ගිණුමට හර නොකළ ගනුදෙනු සැලකිල්ලට ගනු ලබන අතර බැංකුව විසින් තෙවන පාර්ශ්වයකට ගනුදෙනුවට බලය පවරා ඇති ප්‍රවර්තන ශේෂයකට මෙන්ම කාඩ්පත් හිමියා විසින් ඉල්ලීමක් කර වෙන් කර ඇති ගනුදෙනුද ගණනය කිරීමට යටත් වේ.

4.2. මෙම කාඩ්පත් ගිවිසුම අවසන් කිරීම එසේ තිබියදී වුවද කාඩ්පතට බැංකුව විසින් ලබාදී ඇති සියලු පහසුකම්වලටත් ගෙවිය යුතු ගාස්තු සම්බන්ධවත් කාඩ්පත්හිමියා වගකිව යුතුය.

4.3. ඒකාබද්ධ ණය සීමාව වනුයේ බැංකු විසින් වරින් වර දන්වන කාඩ්පත් හිමියා විසින් සියලු කාඩ් ගිණුම් සඳහා වූ උපරිම අවසර දී ඇති සීමාවන් වේ.

4.4. ප්‍රවර්තන ශේෂය වනුයේ කාඩ්පත් හිමියන් පූර්ණ ගෙවිය යුතු ණය වගකීම් හා ඕනෑම අවස්ථාවක මෙම ගිණුමට අනුව කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතු හිඟ ණය ප්‍රමාණය වේ.

4.5. එක් අවස්ථාවක කාඩ්පත් හිමියා විසින් ඔවුන්ගේ කාඩ්පත්වල ප්‍රවර්තන ශේෂ ඒකාබද්ධ ණය සීමාව නොඉක්මවන ලෙස කාඩ්පත් භාවිතා කළ යුතුය. එසේ සීමාව ඉක්මවා ගොස් ඇතිදැයි සොයා බැලීම සඳහා බැංකුව විසින් කාඩ්පත් හිමියා විසින් කළ ගනුදෙනුවක් ඒ වන තෙක් කාඩ්පත් ගිණුමට හර නොකළ ලද්දේ නම් එයද බැංකු විසින් බලාත්මක කර ඇති තෙවන පාර්ශ්ව යෝජිත ගනුදෙනු සැලකිල්ලට ගනු ලැබේ.

4.6. කාඩ්පත් හිමියා විසින් කාඩ්පත් ගනුදෙනුවක් කිරීමෙන් පසු ඒකාබද්ධ ණය සීමාව පෙර අනුමැතියක් සහිතව හෝ රහිතව ඉක්මවා යන අවස්ථාවක කාඩ්පත් හිමියා විසින් වහාම එසේ ඉක්මවූ ප්‍රමාණය බැංකුව දක්වන අකාරයට ගෙවා දැමීමට කටයුතු කළ යුතු වේ. මෙයට කාඩ්පත් හිමියා අනුකූල නොවූ විට ප්‍රතිකර්ම සඳහා ඇති බැංකු නීතියට අගතියක් නොවන ආකාරයට කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිවිසුම අවසන් කරනු ඇත.

**5. ණය සීමාව**

5.1. ණයපත් ණය සීමාව බැංකුවේ පූර්ණ අභිමතය මත නිශ්චය කරන අතර එය ලිඛිතව කාඩ්පත් හිමියා වෙත දන්වනු ලැබේ. එමෙන්ම ලිඛිතව දැනුම්දීමකින් පසු ණය සීමාව වැඩි කිරීමේ හෝ අඩු කිරීමේ අයිතිය බැංකුව විසින් රඳවා තබාගනු ඇත. එමෙන්ම කාඩ්පත් හිමියාගේ ගිණුම තුළ මුදල් හා මුදල් නොවන ගනුදෙනු සඳහා ද සීමාවන් බැංකුව විසින් පැනවීමට හැකි වන්නේය.

5.2. කාඩ්පත් හිමියාගේ කාඩ් ගිණුමේ පවතින ණය සීමාව වනුයේ ඕනෑම අවස්ථාවක ගිණුම් සීමාවෙන් භාවිතයට නොගත් ණය ප්‍රමාණය වන අතර, එය ගණනය කිරීමේදී බැංකුව විසින් දැනටම පිළිගෙන ඇති කාඩ්පතේ ගනුදෙනු එනමුත් ගණනය සඳහා නොලැබී ඇති මෙන්ම හෝ ගෙවීමට ඇති ඉතිරි ප්‍රමාණයන් හෝ වෙනත් මූල්‍ය හෝ මූල්‍ය නොවන ගනුදෙනු සීමාවන් පවතින විට පවත්නා ණයවර ඒ ආකාරයෙන් බෙදී යනු ඇත. එමෙන්ම කාඩ්පත් හිමියන් විසින් කාඩ්පත භාවිතයේදී කාඩ්පතේ ගනුදෙනු සැමවිටම අදාළ ණයවර සීමාව තුළ සිදුකිරීමටද භාරගත යුතුය.

5.3. කාඩ්පත් ගිණුමේ ණයවර සීමාව ඉක්මවා යෑම කාඩ්පත් හිමියා විසින් කරනු ලබන ගිවිසුම් නියමයන් හා කොන්දේසි උල්ලංඝනයක් සේ සලකනු ලබයි. එවැනි අවස්ථාවක බැංකුවට තම අභිමතය භාවිතයෙන් පෙර දැන්වීමකින් තොරව කාඩ් ගිණුම අවලංගු කළ හැකිය.

**6. බිල්පත් කිරීම හා ගෙවීම**

6.1. කාඩ්පත් හිමියාට විවිධ හේතූන් මත බැංකුව විසින් ආපසු ගනුදෙනුවෙන් පසුව ලබාදිය හැකි මුදල් එවන් ආපසු ගෙවිය යුතු මුදල් ලැබුණු පසුව එය අදාළ කාඩ්පත් ගිණුමට බැර කරනු ඇත.

6.2. ගුවන් ටිකට්පතක් මිලදී ගැනීමේදී ආපසු ලැබිය හැකි මුදල් ගැන නොසලකා කාඩ්පත් හිමියා මිල සටහන් කිරීම් කාර්ය සඳහා ගුවන් ටිකට්පතේ මුළු මුදලම කාඩ්පත භාවිතයෙන් ගෙවිය යුතුය. එවැනි ටිකට්පතක් පසුව අවලංගු කිරීමේදී ආපසු ගෙවීම බැර කරනු ලබන්නේ කාඩ්පතේ ගිණුමට වේ. (එහිදී අවලංගු කිරීමේ ගාස්තු අඩු කරගනු ඇත). තවද, එකී ආපසු ගෙවීම ගුවන් ටිකට්පත මුලින්ම මිලදීගත් කවුළුවෙන්ම සිදුකරනු ලබන අතර එය ලැබුණු විගස කාඩ්පත් ගිණුමට බැර කරනු ඇත.

6.3. අවලංගු කිරීම හේතු කොට ඇතිවිය හැකි හුවමාරු පාඩු, ගනුදෙනුවක වෙනස්වීම හෝ ආපසු ගෙවීම් යනාදියට කාඩ්පත්හිමියා බැංකුවට වගකිවයුතු වේ.

6.4. කාඩ්පත් හිමියාගේ ඉල්ලීම අනුව බැංකුව විසින් විද්‍යුත් පණිවිඩ මාර්ගයෙන්

මාසික ප්‍රකාශ එවීමට එකඟවූ විට කාඩ්පත් හිමියා විසින් එවැනි සියලු ප්‍රකාශ විද්‍යුත් හෝ වෙනත් මාර්ගයකින් තමා වෙත ලැබී ඇති බව පිළිගනු ලබයි. එසේ එකඟ වූ පසු මෙන්ම කාඩ්පත් ප්‍රකාශ නොලැබුණේ යැයි කාඩ්පත් හිමියාට පැමිණිලි කිරීමට හැකියාවක් නොමැත. එමෙන්ම විද්‍යුත් තැපැල් මගින් එවනු ලබන ප්‍රකාශවල රහස්‍යභාවය බැංකුව විසින් භාරගනු නොලැබේ. එමෙන්ම බැංකුව විසින් විටින් විට කියාපාන්නාවූ උපදෙස් කාඩ්පත් හිමියා විසින් පිළිගත යුතු අතර ප්‍රකාශ නොලැබීම සම්බන්ධව බැංකුව වගකියනු නොලැබේ.

6.5. ශ්‍රී ලංකා මුදල් විදේශීය මුදල්වලට හැරවීමේදී හෝ පවත්නා විනිමය අනුපාත නිසිලෙස සිදුකර ඇති බවද කාඩ්පත් හිමියා පිළිගත යුතු කරුණකි. කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ මුදල් වෙනත් මුදලකට හැරවීමේදී අවසානයේදී සියලු කාඩ්පත් ගනුදෙනු ශ්‍රී ලංකා මුදලින් කර ඇති බවටත් කාඩ්පත් හිමියාගෙන් බැංකුවට වන වගකීම්ද ශ්‍රී ලංකා මුදලින් සිදුවී ඇතිදැයි ගණන් බලනු ලැබේ.

6.6. සියලු හැරවීම් හා නැවත හැරවීම් බැංකුවට විනිමය අලාභයක් නොවන ලෙස සිදු කෙරෙනු ඇත. එමෙන්ම කාඩ්පත් හිමියා මෙයින් පොරොන්දු වනුයේ එකී ගනුදෙනුවලදී බැංකුවට විනිමය අලාභයක් සිදු නොවන ලෙස වන්දි පූර්ණ කිරීමට වේ. විනිමය අලාභයක් යනු බැංකුව හෝ තම නියෝජිතයින් විසින් දැරිය යුතු අලාභයක් වන අතර එසේ සිදුවනුයේ එකී මුදල් ඒකකවල අඩුවැඩි වීම හෝ අවප්‍රමාණ කිරීම් හේතුවෙනි.

6.7. තමාගේ මරණය සිදුවන අවස්ථාවේදී, කාඩ් ගිණුමේ ඇති ඉතිරි ගෙවුම් ප්‍රමාණයන් හා වගකීම් තමාගේ උරුමක්කරුවන් නීත්‍යානුකූල නියෝජිතයින් හෝ සමීප ඥාතීන් විසින් ගෙවා දමනු ඇති බවට කාඩ්පත් හිමියා මෙයින් පොරොන්දු වේ.

6.8. කාඩ්පත් හිමියා මාසික ප්‍රකාශයේ සඳහන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ගෙවා දැමීමට අපොහොසත් වූ විට කාඩ් ගිණුමට ප්‍රමාද ගාස්තුත් එකතු වන අතර මෙම ගාස්තු ප්‍රමාණය බැංකුවේ අභිමතය පරිද්දෙන් සිදුවනු ඇත.

**7. පුද්ගලික හැඳුනුම් අංකය නිකුත් කිරීම හා පුද්ගලික හැඳුනුම් අංකය (PIN) හා කාඩ්පත නැති වීම.**

7.1. බැංකුව විසින් කාඩ්පත් හිමියාට පුද්ගලික හැඳුනුම් අංකයක් ATM යන්ත්‍රයන්හි භාවිතය සඳහා එවනු ඇත. කාඩ්පත් හිමියා තම අවදානමට යටත්ව එකී අංකය (PIN) තැපෑලෙන් හෝ කුරියර් සේවා මගින් ලබා ගැනීමට එකඟ වේ. එසේ ලබාගෙන සක්‍රිය කිරීමෙන් පසු එම පුද්ගලික හැඳුනුම් අංකය (PIN) කාඩ්පත් හිමියාගේ දේපළක් වන අතර කාඩ්පත් හිමියා විසින් එය ආරක්ෂාකර ගැනීමට සියලු පූර්වාරක්ෂාවන් ගත යුතුවේ.

7.2. කාඩ්පත් හිමියා විසින් පුද්ගලික හැඳුනුම් අංකය (PIN) භාවිතයෙන් සිදු කරනු ලබන සියලු ගනුදෙනුවලට වගකිවයුතු වේ.

7.3. කාඩ්පත් හිමියා විසින් කාඩ්පත් මෙන්ම පුද්ගලික හැඳුනුම්පත් අංකයේ (PIN) ආරක්ෂාව සඳහා සියලු පියවර ගත යුතුවේ.

7.4. කාඩ්පත නැතිවූ විටෙක ඒ බව විස්තර සහිතව බැංකුව වෙත ක්ෂණිකව දැන්විය යුතු අතර එය දුරකථන පණිවුඩයකින්, ෆැක්ස් මාර්ගයෙන්ද අදාළ ගෙවුම් ආයතනයේ නිලධාරියෙකුටද දැන්විය යුතුවේ. එසේ වුවද, නැතිවූ වග ලිඛිතව බැංකුව විසින් සනාථකරන තෙක් කාඩ්පත හරහා කර ඇති ගනුදෙනුවලට කාඩ්පත් හිමියා වගකිව යුතුවේ.

7.5. කාඩ්පත නැතිවූ පසු ඒ බව බැංකුවට දැන්වීමෙන් පසු ලිඛිතව සනාථ කරන තුරු කාඩ් ගිණුමෙන් බලය නොලබා අයකරනු ලබන සියලු ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා පූර්ණව වගකිව යුතුවේ.

7.6. කාඩ්පත නැතිවූ විට ඒ සම්බන්ධව කාඩ්පත සොයා ගැනීම සඳහා බැංකුවට උපකාර කිරීමේදී අවශ්‍ය විය හැකි තොරතුරු සොයා ගැනීමට කාඩ්පත් හිමියා විසින් තමා සන්තකයේ ඇති සියලු තොරතුරු බැංකුව වෙත ලබා දිය යුතුය.

7.7. බැංකුවට යෝග්‍ය යැයි සිතන නියමයන් හා කොන්දේසිවලට යටත්ව නැතිවූ අවස්ථාවක බැංකුව විසින් ප්‍රතිස්ථාපන කාඩ්පතක් මෙන්ම නව පුද්ගලික හැඳුනුම් අංකයක්ද (PIN) බැංකුවේ පූර්ණ අභිමතයට අනුව ලබාදිය හැකිය.

7.8. එසේ නැතිවූ හෝ අස්ථානගතව තිබූ කාඩ්පත නැවත කාඩ්පත් හිමියා විසින් සොයා ගත් අවස්ථාවක එය භාවිතා නොකොට එම කාඩ්පත දෙකට කපා වහාම බැංකුවට භාරදිය යුතුය. පුද්ගලික හැඳුනුම් අංකය (PIN) වෙනත් තෙවන පාර්ශ්වයකට දැනුම් දුනහොත් ඒ බව බැංකුවට දැනුම් දී ඉන්පසු එම අංකය භාවිතා නොකළ යුතුය.

7.9. නැතිවූ කාඩ්පත් සම්බන්ධව, නව කාඩ්පතක් නිකුත් කිරීම සඳහා වන ගාස්තුද වෙළඳ ජාලයකට නව කාඩ්පත හඳුන්වා දීමට යන වියදම් ද ඇතුළුව ගාස්තුවක් කාඩ්පත් හිමියාගෙන් අය කරනු ලැබේ.

**8. කාඩ්පත් ගිණුම**

8.1. බැංකුව විසින් කාඩ්පත් ගනුදෙනු ප්‍රමාණයන්, බැංකුවට අයවිය යුතු ගාස්තු, කාඩ්පත් හිමියාගේ වගකීම්ද ඇතුළුව නෛතික වියදම්, බැංකුව විසින් දැරූ පාලන වියදම් ද කාඩ්පත් ගිණුමට හර කරනු ලැබේ. ප්‍රාථමික කාඩ්පත් හිමියා මෙන්ම අමතර කාඩ්පත් හිමියාද එසේ හර කර ඇති මුදල් බැංකුවට ගෙවීමට එක්ව හා වෙන් වෙන්ව ගෙවීමට වගකිව යුතුවේ. එය සිදුවනු ලබන්නේ කාඩ්පත් හිමියා පමණක් ගනුදෙනුවලට අත්සන් කර ඇතැයි යන්න නොසලකා හරිමිනි.

8.2. බැංකුව විසින් කාඩ්පත් හිමියා වෙත ගිණුම් ප්‍රකාශයක් එවන අතර එහි සඳහන් ගෙවිය යුතු අවම ප්‍රමාණය නියමිත ගෙවීම් දිනයට ප්‍රථම ගෙවිය යුතුවේ. එසේ වුවද, කාඩ්පත් හිමියාට තම අභිමතයට අනුව ගෙවිය යුතු මුළු මුදල හෝ අවම ගෙවීම් ප්‍රමාණයට වැඩි ගෙවීමක් සිදුකළ හැකිය.

8.3. මෙම ගිවිසුම උල්ලංඝනය වූ අවස්ථාවක හෝ තමා බංකොලොත් භාවයට පත්ව ඇතැයි යන අවස්ථාවක හෝ ප්‍රාථමික කාඩ්පත් හිමියා මරණයට පත් වූ විට හෝ බැංකුවේ පූර්ණ අභිමතය පරිද්දෙන් මෙම ගිවිසුම යටතේ ගෙවිය යුතු සියලු මුදල් ව්‍යවස්ථා යටතේ පනවන සීමාවන්ට යටත්ව ගෙවා දැමිය යුතුය.

8.4. බැංකුව වෙත කරනු ලබන සියලු ගෙවීම් වලංගු වනු ලබන්නේ එම මුදල් බැංකුව විසින් දන්වා ඇති ලිපිනයට ලැබීමෙන් පසු කාඩ්පත් ගිණුමට බැර කිරීමෙන් පසුවය. බැංකුව වෙත ලබාදී ඇති චෙක්පත් සලකා බැලීම සඳහා ප්‍රාථමික කාඩ්පත් හිමියා විසින් ගිණුමේ අවශ්‍ය මුදල් තිබෙන බව සනාථ කර ගත යුතුවේ.

**9. මුදල් අත්තිකාරම්**

9.1. කාඩ්පත් හිමියාට ණය සීමාවේ උපරිම සීමාවට ගණන් ගැනෙන ණයවර ප්‍රමාණය ඇති විට මෙන්ම විනිමය පාලකගේ රෙගුලාසිවලට යටත්ව කාඩ්පත භාවිතයෙන් මුදල් අත්තිකාරම් ද ලබාගත හැකිය.

9.2. (a) කාඩ්පත බැංකුවේ ඕනෑම ශාඛාවක හෝ ආයතනයේ සාමාජිකයෙකු වෙත කාඩ්පත හිමියාගේ අනන්‍යතාවය තහවුරු කෙරෙන සාක්ෂි සමග ඉදිරිපත් කිරීම හා අවශ්‍ය ගනුදෙනු වාර්තා අත්සන් කිරීම.

(b) බැංකුවේ ඕනෑම ATM යන්ත්‍රයක හෝ එම යන්ත්‍ර භාවිතය සඳහා බැංකුව විසින් ගිවිසුම්ගතකර ඇති වෙනත් බැංකුවක හෝ ආයතනයක ATM යන්ත්‍රයක් භාවිතා කිරීමේදී අදාළ ATM යන්ත්‍රයට යොදාගත හැකි දෛනිකව මුදල් අත්තිකාරම් ලබාදීමේ සීමාවන්ට ඔබේ අත්තිකාරම් ඉල්ලීම යටත් වනු ඇත.

9.3. මුදල් අත්තිකාරම් ගැනීමේදී ATM යන්ත්‍රය, බැංකුව, වෙළෙන්ද, නියෝජිත, දේශීය හෝ අදාළ රටේ පනවා ඇති සීමාවන්, විනිමය පාලන රෙගුලාසි, කලින් කලට නිකුත් කරන අධිකාරී සීමාවන්, යන සියලු දේ බලපානු ඇත. බැංකුව විසින් ATM ගනුදෙනු සඳහා ඔබ වෙත පුද්ගලික හැඳුනුම් අංකයක් (PIN) ලබාදෙන අතර එය කුමන හේතුවක් නිසාවත් වෙනත් තැනැත්තෙකුට අනාවරණය නොකළ යුතුය.

9.4. පුද්ගලික හැඳුනුම් අංකය (PIN) භාවිතයෙන් කරනු ලබන, ගනුදෙනු බැංකුවේ වාර්තා වන අතර, ඒ සියල්ල සඳහා කාඩ්පත්හිමියා බැඳීමට ලක් වේ.

9.5. කාඩ්පත් හිමියා කාඩ්පත භාවිතයෙන් මුදල් අත්තිකාරමක් ලබා ගැනීම කාඩ්පත්හිමියාගේ ගිවිසුමට අනුව, මුදල් අත්තිකාරම් සඳහා බැංකුව විසින් නියම කර ඇති මූල්‍ය ගාස්තුවක්, පොලිය, වෙනත් ගාස්තු ගෙවීම සඳහා යැයි සලකනු ලැබේ. එම ගාස්තු කලින් කලට වෙනස් වනු ඇත. එමෙන්ම ගනු ලබන මූල්‍ය අත්තිකාරම් සඳහා වෙනත් මූල්‍ය ගාස්තුවක් එසේ ගනු ලබන අත්තිකාරම් පියවන තෙක් අයකරනු ඇත.

9.6. කාඩ්පත භාවිතයෙන් මිලදී ගනු ලබන පහසුවෙන් මුදල්වලට හැරවිය හැකි නීත්‍යානුකූල ලේඛන වන පෙර ගෙවූ ගමන් කාඩ්පත්, ඉල්ලුම් අණකර, විදුලි මුදල් මාරු යනාදිය ද මුදල් අත්තිකාරම් සේ සැලකෙන අතර 09.5 හේ සඳහන් අමතර ගාස්තු ද එයට බලපැවැත්වේ.

9.7. මෙම පහසුකම් කාඩ්පත්හිමියාට පෙර දැනුම්දීමක් කිරීමෙන් මෙන්ම අත්හිටුවීමට බැංකුවට හැකියාවක් ඇත.

**10. අතිරේක කාඩ්පත**

10.1. බැංකුව විසින් තමන්ගේ පූර්ණ අභිමතය පරිද්දෙන් මූලික කාඩ්පත්හිමියා විසින් නම්කළ පුද්ගලයෙකු/යන්ට අතිරේක කාඩ්පතක්/පත් ඔවුන් එක්ව ඉල්ලා සිටි විට නිකුත් කිරීම සලකා බලනු ඇත. අතිරේක කාඩ්පත් හිමියන් වයස අවුරුදු 18 ට වැඩි විය යුතු වන අතර ඔවුන් කාඩ්පත්හිමියාගේ සමීප ඥාතීන් (කලත්‍රයා, දරුවා, සහෝදර, සහෝදරියන්) විය යුතුය. ප්‍රාථමික කාඩ්පත් හිමියාගේ ඍජු යැපෙන්නෙකු වන ශිෂ්‍යයෙකු තමන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අතිරේක කාඩ්පතකට හිමිකරුවෙකු වන අතර ගිවිසුමේ කොන්දේසි හා නියමයන්ට ඔවුහු බැඳී සිටිනු ඇත.

10.2. ප්‍රාථමික කාඩ්පත්හිමියාට වෙන්කර ඇති ණයවර සීමාවට අතිරේක කාඩ්පත් හිමියාගේ ණයවර සීමාවද ඇතුළත් වේ. ඒ අනුව ප්‍රාථමික හා අතිරේක කාඩ්පත්හිමියන් විසින් තම කාඩ්පත් මගින් වියදම් කරනු ලබන මුළු ප්‍රමාණයන් එකී ණයවර සීමාව නොඉක්මවිය යුතුවේ.

10.3. අතිරේක කාඩ්පතේ වලංගුභාවය ප්‍රාථමික කාඩ්පතේ වලංගුභාවය මත රඳා පවතිනු ඇත. අතිරේක කාඩ්පත අවසන් කිරීම හේතුවෙන් ප්‍රාථමික කාඩ්පත අවසන් නොකෙරේ.

10.4. ප්‍රාථමික හා අතිරේක කාඩ්පත් හිමියන්ගේ බැංකුවට හා බැංකුවේ අයිතීන්වලට ප්‍රතිඥා, පොරොන්දු, වගකීම්, හා බැඳීම් ප්‍රාථමික කාඩ්පත් හිමියා හා අතිරේක කාඩ්පත්හිමියා අතර ඇතිවියහැකි ආරවුලකදී බලනොපානු ඇත.

10.5. කාඩ්පත් හිමියා හා අතිරේක කාඩ්පත් හිමියන් විසින් එක්ව හා වෙන් වෙන්ව කාඩ්පත් භාවිතයෙන් කරන ලබන සියලු ගනුදෙනුවලට වගකිවයුතු වේ.

10.6. ප්‍රාථමික කාඩ්පත්හිමියා විසින් අතිරේක කාඩ්පත්හිමියන්ට ලබාදී ඇති බලතල, අදාළ කාඩ්පත් දෙකට කපා ලිඛිත දැන්වීමක් සමග එවීමෙන් එතෙක් ලබාදී ඇති බලතල ඉවත් කරගත හැක.

10.7. එසේ ඉවත් කරගැනීමේ දිනයට ප්‍රථම අතිරේක කාඩ්පත් හිමියා විසින් ඉහත 10.6 යටතේ සිදුකර ඇති සියලු කාඩ්පත් ගනුදෙනු සඳහා කාඩ්පත්හිමියා වගකීම් දරනු ඇත.

10.8. අතිරේක කාඩ්පත් හිමියාගේ නෛතික නොහැකියාවක් හෝ අයෝග්‍යතාවයන් හේතුවෙන් බැංකුවට සිදුවිය හැකි අලාභ, පාඩු නියමයන් හෝ කොන්දේසි උල්ලංඝනය කිරීම හේතුවෙන් බැංකුවට සිදුවිය හැකි අගතීන්ගෙන් බැංකුව වන්දි පූර්ණය කිරීමට ප්‍රාථමික කාඩ්පත්හිමියා බැඳී සිටී.

**11. කාඩ්පතේ පිළිගැනීම.**

11.1. කාඩ්පත පිළිගනු ලබන්නේ එය නියමාකාරයෙන් ප්‍රාථමික හෝ අතිරේක කාඩ්පත් හිමියන් විසින් සිය අත්සන් තබා ඇති විටදීය. වෙළෙඳ ආයතනයක්

විසින් අදාළ කාඩ්පත ප්‍රතික්ෂේප කිරීම කුමන කාරණයක් මත පැවතියත් බැංකුව විසින් ඒ සඳහා වගකියනු නොලැබේ. වෙළෙඳ ආයතන හා මූල්‍ය ආයතන සාමාන්‍යයෙන් විදහා දැක්වෙන නිෂ්පාදිත සංකේත ගරු කරනු ලැබේ.

11.2. පිරවුම්හල්වලින් පෙට්‍රල්, ඩීසල් හා ගෑස් නිෂ්පාදන මිලදී ගැනීමේදී පරිහරණ හා සේවා ගාස්තුවක් ගෙවිය යුතුවේ.

11.3. එසේ වුවද කාඩ්පත් හිමියා විසින් එසේ නිෂ්පාදන විකිණීම ප්‍රතික්ෂේප කරනු ලබන වෙළෙඳසැල/බැංකුවක් වෙතොත් ඒ සම්බන්ධව සියළු විස්තර, ගනුදෙනුවේ දිනය හා වේලාව, ස්ථානයේ නම් යනාදිය වැඩිදුර විමර්ශන සඳහා බැංකුව වෙත වාර්තා කළ යුතුය.

**12. ගිණුම් ප්‍රකාශය.**

12.1. බැංකුව විසින් කාඩ්පත් ගිණුමේ ගනුදෙනු අඩංගු ප්‍රකාශයක් පෙර නිශ්චිත දිනයක මාසිකව විද්‍යුත් තැපෑලෙන් එවීමට කටයුතු කරනු ඇත. ඡේද 6.4 හි අඩංගු නියමයන් අදාළ ඉලෙක්ට්‍රොනික ප්‍රකාශ පහසුකමේ සඳහන් කෙරේ. එසේ වුවද මෙම විද්‍යුත් ප්‍රකාශ පහසුකම සඳහා ලියාපදිංචි වීමට අකැමති පාරිභෝගිකයන් මුද්‍රිත ප්‍රකාශ ලබා ගැනීම සඳහා සුළු නාමික මාසික ගාස්තුවක් ගෙවිය යුතුවේ. අවසන් ප්‍රකාශයෙන් පසු ශේෂ ඉතිරියක් නොමැති එමෙන්ම කාඩ්පත් ගනුදෙනු ද නොමැති වූවිට බැංකුව විසින් ප්‍රකාශයක් නිකුත් කරනු නොලැබේ.

12.2. ගිණුම් ප්‍රකාශයක් නොලැබීම ප්‍රමාදයකින් තොරව ගෙවිය යුතු මුදල් නොගෙවීමට කිසිසේත් වලංගු හේතුවක් නොවනු ඇත. කාඩ්පත් හිමියා විසින් තමන්ට සාමාන්‍යයෙන් ගිණුම් ප්‍රකාශය ලැබිය යුතු දින දහය තුළ එසේ නොලැබුනු විට තමන් විසින් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය කාඩ්පත් මධ්‍යස්ථානයෙන් දැනගත යුතුය.

12.3. කාඩ්පත් හිමියා විසින් තමන් වෙත ලැබෙන සෑම ගිණුම් ප්‍රකාශයක්ම පරීක්ෂා කර එකී අනුමාන කළ හැකි කිසියම් හෝ වරදක් වෙතොත් ඒ සම්බන්ධව ප්‍රකාශය ලැබී දින 14ක් තුළ කාඩ් මධ්‍යස්ථානය වෙත දැන්විය යුතුය. කාඩ්පත් හිමියා විසින් එවන් වැරදි අදාළ දින 14 තුළ කාඩ්පත් මධ්‍යස්ථානයට දැන්වීම පැහැර හැරි අවස්ථාවක හෝ දැන්වීමට අසමත් වූ විට ගිණුම් ප්‍රකාශයේ ඇති සියලු ගනුදෙනු සම්බන්ධව කාඩ්පත් හිමියා බැඳී සිටින අතර එහි අඩංගු සියලු දේ සම්බන්ධව ගිණුම් ප්‍රකාශය නිශ්චිත සාධකය වනු ඇත. ඒ අනුව, කාඩ්පත් හිමියාට ප්‍රකාශයේ අඩංගු දේ සම්බන්ධව තර්ක කළ නොහැක. සියළු ගිණුම් ප්‍රකාශ කාඩ්පත් හිමියා ලබාදී ඇති ලිපිනයට සාමාන්‍ය තැපෑලෙන් එවනු ලබන අතර එය පැය 48 ක් තුළ ලැබුනේ යැයි සැලකේ. තම කාඩ්පත් ගිණුම සම්බන්ධව පැමිණිල්ලක් වෙතොත් එකී කාඩ්පත් හිමියා විසින් දුරකථන අංක 1961 ට හෝ බැංකුව විසින් විටින් විට තම වෙබ් අඩවියේ දක්වා ඇති අංකයට දැන්විය යුතුය.

12.4. කාඩ්පත් ගිණුමේ පෙර ප්‍රකාශ දිනයේ සිට පවත්නා ප්‍රකාශ දිනයේ දී ව්‍යාපාර වැසීම දක්වා වූ කාලය තුළ ක්‍රියාත්මක වී ඇති සියලු කාඩ්පත් ගනුදෙනු ගිණුම් ප්‍රකාශයේ විස්තර කර ඇත.

12.5. ගිණුම් ප්‍රකාශයේ හිඟව තිබෙන ප්‍රමාණයන් පහත සඳහන් ආකාරයෙන් සෑදේ.

12.5.1. කාඩ්පත භාවිතයෙන් මිලදීගෙන ඇති සියලු භාණ්ඩ හා සේවාවන් මිල ගණන්, කාඩ්පත් හිමියා බලාත්මක කර ලබාගෙන ඇති සියලු තැපැල් හා දුරකථන ඇණවුම් ද ඊට අයත් වේ. එමෙන්ම අතිරේක කාඩ්පත් හිමියන් බලාත්මක කර ඇණවුම් කර ඇති තැපැල් හා දුරකථන ඇණවුම්ද ඊට අයත් වේ.

12.5.2. කාඩ්පත් හිමියා කාඩ්පත් ගිණුමෙන් කරන ලද මුදල් අත්තිකාරම් මෙන්ම ATM යන්ත්‍ර හරහා සිදුකර ඇති මුදල් අත්තිකාරම්.

12.5.3. ඡේද 13 (ගෙවීම් හා ගාස්තු) යටතේ දක්වා ඇති මෙම ණයපත් භාවිතයේ නියමයන් හා කොන්දේසි වන ගාස්තු, සේවා ගාස්තු යනාදියත් පවත්නා රජයේ බදු ඇතුළු අනෙක් බැංකු ගාස්තු, මෙන්ම ණයපත භාවිතයෙන් ඇතිවන පොලිය.

**13. ගෙවීම් හා ගාස්තු.**

මෙම වගන්තියේදී යොමුවන ගාස්තු හා පවතින අයකිරීම් හි විස්තර බැංකුව විසින් ප්‍රකාශ කර ඇති සේවා හා මිල ගණන් සඳහා වූ මාර්ගෝපදේශයේ විස්තර කර ඇති අතර එහි පිටපත් ඉල්ලා සිටීමෙන් ලබා ගත හැක. පූර්ව දැන්වීමක් සමග මෙම ගාස්තු හා අයකිරීම් කලින් කලට වෙනස් විය හැකිය.

13.1. බැංකුව විසින් ඉල්ලා සිටින බැඳීම් ගාස්තුවක් හා වාර්ෂික ගාස්තුවක් කාඩ්පතට මෙන්ම අතිරේක කාඩ්පතට ගෙවීමටද කාඩ්පත් හිමියා එකඟ වේ. කාඩ්පත භාරගැනීම ප්‍රතික්ෂේප කිරීමේදී හෝ කාඩ්පත අවසන් කිරීමේදී බැඳීම් ගාස්තුව ආපසු දෙනු නොලැබේ.

13.2. කාඩ්පත්හිමියා ගිණුම් ප්‍රකාශයේ දක්වා ඇති මුළු මුදල් ප්‍රමාණය ගෙවා දැමීමට එකඟවන අතර එම ප්‍රමාණය ගිණුම් ප්‍රකාශයේ පවත්නා ශේෂය ද වේ. එය ගිණුම් ප්‍රකාශයේ නියමිත දිනට ප්‍රථම සම්පූර්ණයෙන්ම ගෙවිය යුතු අතර එසේ කළ විට කාඩ්පත්හිමියාට මුදල් අත්තිකාරම්වලට හැර අන් ගනුදෙනු සඳහා මූල්‍ය ගාස්තු ගෙවීමට සිදු නොවේ.

13.3. කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතු සම්පූර්ණ මුදල නියමිත දිනයේ නොගෙවන විට බැංකුව විසින් නිශ්චය කරනු ලබන දෛනිකව ගණන් බැලෙන අනුපාතයකින් ප්‍රකාශ ශේෂය සඳහා ගෙවිය යුතුවේ. මෙම ගෙවීම පවත්නා ප්‍රකාශයේ පළමු දින සිට ඊළඟ ප්‍රකාශ දිනය දක්වා අය කෙරේ. ඉහත සඳහන් කාලය තුළ ලැබෙන බිල්පත් සඳහා මෙම පොලිය ගණනය නොකෙරේ.

13.4. බැංකුව විසින් කලින් කලට අයකළ යුතු මාසික පොළී අනුපාතයන් නිශ්චය කරනු ලබයි. පොලිය අයකිරීමේ සාමාන්‍ය ක්‍රියා පිළිවෙත වනුයේ කාඩ්පත් ගිණුමට ගෙවීමක් කළ විට එකී ගෙවුම් දිනය දක්වා, පූර්ණ හර ශේෂය මත පොළිය ගෙවීමය. ඒ අනුව සියලු කොටස් වශයෙන් ගෙවීමේදී එවැනි ගෙවීම් කළ දිනයේ දී වූ හිඟව තිබෙන ශේෂයට මෙන්ම ප්‍රකාශය නිකුත් කළ දිනට වූ හිඟ මුදල් වෙතොත් එයද එදිනට දක්වා වූ හිඟ මුදල්ද ගෙවිය යුතුවේ.

13.5. කාඩ්පත් හිමියාට තමන්ගේ කාඩ්පත් ගිණුම විවෘත කිරීමෙන් පසුව ලැබෙන පළමු ප්‍රකාශනයේ දිනය දක්වා කරන ලද ගනුදෙනු විස්තර මෙන්ම එදිනට දක්වා වූ ගාස්තු හා ගෙවීමද සඳහන් කර ඇත. මුදල් අත්තිකාරමක් ලබා නොගත්තේ නම් පොලී ගාස්තු සඳහන් නොවන අතර මුදල් අත්තිකාරම් ලබා ගත්තේ නම් පොලී ගාස්තුවත් සඳහන් වනු ඇත. ගෙවීම් කළ යුතු දිනයේදී හෝ ඊට ප්‍රථම මුළු ගෙවීම් ප්‍රමාණයම ගෙවුයේ නම් පොලියක් අය නොකරනු ඇත.

13.6. පොලිය අය කරනු ලබන්නේ ගෙවිය යුතු මුළු මුදල් ප්‍රමාණය නොගෙවා ගෙවිය යුතු අවම ප්‍රමාණයට වැඩි මුදලක් ගෙවූ විටදීය. එසේ ගෙවිය යුතු පොලී ප්‍රමාණය ප්‍රකාශයේ ඊළඟට අයවිය යුතු කාල පරිච්ඡේදයේ දක්වා ඇත. එසේ වුවද එසේ අයවිය යුතු කාල පරිච්ඡේදයේදී (මුදල් අත්තිකාරම් හැර) එම කාලය තුළ පොලියක් අයකරනු නොලැබේ.

13.7. ඒ අනුව ගිණුම් ප්‍රකාශයේ දක්වා ඇති ගෙවිය යුතු මුළු ප්‍රමාණයම ගෙවා දමන කාඩ්පත් හිමියෙකු මුදල් අත්තිකාරම් හැර අන් සියලු ගනුදෙනුවලින් පොලිය ගෙවීමෙන් මුදාහරිනු ලැබේ.

13.8. මුදල් අත්තිකාරම් සඳහා පොලිය අත්තිකාරම් ලබාගත් දිනයේ සිට පූර්ණව බේරුම් කරන දිනය දක්වාම අයකරනු ලැබේ.

13.9. ගෙවිය යුතු අවමය ගෙවීම් කළ යුතු දිනයට හෝ ප්‍රථමයෙන් නොගෙවන කාඩ්පත් හිමියෙකු කලින් කලට නියම කරනු ලබන ප්‍රමාද ගාස්තුවක්ද පොලියට අමතරව ගෙවිය යුතුවේ.

13.10. බැංකුවට කලින් කලට නිශ්චය කෙරෙන ගාස්තු මෙන්ම අනෙකුත් අයකිරීම් ගෙවීමට කාඩ්පත් හිමියා එකඟ වේ.

13.11. කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතු දිනයේදී පවත්නා ශේෂය නොගෙවුවහොත් දෛනිකව ගණන් බලන මූල්‍ය ගාස්තුවක් ගෙවිය යුතුවන අතර කාඩ්පත්

ගිණුමට ගෙවීම් බැරකරන තෙක් එසේ කරන අතර ඉන්පසු අඩුවන ශේෂය යටතේ ගෙවීම් කළ යුතුවේ.

13.12. කාඩ්පත්හිමියාගෙන් ලැබෙන සියලු ගෙවීම් බැංකුව විසින් පහත සඳහන් ගෙවීම් ක්‍රමය යටතේ හෝ බැංකුව යෝග්‍ය යැයි සිතන වෙනත් ප්‍රමුඛත්වයක් යටතේ යොදාගනු ඇත.

13.12.1. සියලු නොගෙවූ මූල්‍ය ගාස්තු, සේවා ගාස්තු, මුදල් අත්තිකාරම් හා පෙර ගිණුම් ප්‍රකාශයේ දක්වා ඇති සියලු වියදම්.

13.12.2. පවත්නා ගිණුම් ප්‍රකාශයේ දැක්වෙන සියලු නොගෙවූ මූල්‍ය ගාස්තු, මුදල් අත්තිකාරම්, සේවා ගාස්තු හා වෙනත් වියදම්.

13.12.3. පෙර ගිණුම් ප්‍රකාශයේ දක්වා ඇති සියලු නොගෙවූ කාඩ්පත් ගනුදෙනු හා මිලදී ගැනීම්.

13.12.4. පවත්නා ගිණුම් ප්‍රකාශයේ දක්වා ඇති නොගෙවූ ගනුදෙනු හා මිලට ගත් ගනුදෙනු.

13.12.5. පවත්නා ගිණුම් ප්‍රකාශයේ තවමත් නොපෙන්වන සියලු මූල්‍ය ගාස්තු, කුලී ගාස්තු, සේවා ගාස්තු, මුදල් අත්තිකාරම් හා අනෙකුත් වියදම්.

13.13. බැංකුවට තමන්ගේ අභිමතය පරිද්දෙන්ම වාර්ෂික ගාස්තු, පරිහරණ ගාස්තු, අතිරේක ගාස්තු, මූල්‍ය ගාස්තු, නියමිත ගෙවිය යුතු අවමය හා/ හෝ ප්‍රමාද ගාස්තු ගණනය කිරීමේ ක්‍රමෝපාය වෙනස් කිරීමට හැකියාවක් ඇත.

13.14. ප්‍රතිස්ථාපන කාඩ්පතක් නිකුත් කරන ලෙස කාඩ්පත් හිමියා බැංකුවෙන් ඉල්ලාසිටි විට, ප්‍රතිස්ථාපන ගාස්තුවකට යටත්ව බැංකුව විසින් ප්‍රතිස්ථාපන කාඩ්පතක් කාඩ්පත් හිමියා වෙත නිකුත් කරනු ඇත. එමෙන්ම බැංකුව විසින් කලින් කලට සපයනු ලබන අනෙකුත් සේවාවන් වන විකුණුම් වවුචර්වල පිටපත්, මුදල් අත්තිකාරම් තුණ්ඩු හා එවැනි වෙනත් දේ සඳහා ද අමතර ගාස්තු අයකරනු ලබයි.

13.15. බැංකුවට ඕනෑම අවස්ථාවකදී ගත හැකි සුදුසු නීතිමය අයිතිවාසිකම්වලට අගතියක් සිදුනොවන ලෙස කාඩ්පත් හිමියා විසින් ලබාදුන් ගෙවිය යුතු මුදල් සඳහා වූ ආපසු එවන ලද චෙක්පත් සඳහා අමතර ගාස්තුවක් අයකරනු ඇත.

13.16. කාඩ්පත්හිමියා විශේෂයෙන්ම එකඟවනුයේ තමන්ගෙන් ඕනෑම අවස්ථාවක කාඩ්පත් ගිණුම හේතුවෙන් බැංකුව යම් ගෙවීමකට වගකීමක් දරන්නේ නම් හා කාඩ්පත් හිමියා එකී ගෙවීම පැහැර හරින්නේ නම් ඊට අදාළ ගෙවීම් කාඩ්පත් හිමියාගේ බැංකුවට අයත් වෙනත් ගිණුමකින් අයකර ගැනීමට බැංකුවට පූර්ණ අයිතියක් ඇත. (19 වන වගන්තිය අදාළ වේ)

13.17. බැංකුවේ නිලධාරියෙකු විසින් කාඩ්පත්හිමියාගෙන් යම්කිසි මුදලක් කිසියම් දිනකදී බැංකුවට ගෙවිය යුතු යැයි යනුවෙන් නිකුත් කෙරෙන සහතිකයක් එදිනට බැලූ බැල්මේ සාක්ෂියක් වශයෙන් සැලකෙනු ඇත.

13.18. කරනු ලබන මුදල් තැන්පතුවක් බැංකුව විසින් පිළිගනු ලබන්නේ එකී මුදල කාඩ්පත් ගිණුමට බැරවීමෙන් පසුවය.

13.19. තැන්පත් කරනු ලබන චෙක්පතක් එක්රැස් කිරීම සඳහා පිළිගනු ලැබුවද එහි මුදල අදාළ ගෙවීම සඳහා සලකනු ලබන්නේ චෙක්පත නිෂ්කාශනය වී අදාළ මුදල බැංකුව වෙත ලැබුණු පසුවය. අපේ ATM යන්ත්‍රයන් හි එකතු වන තැන්පත් කළ මුදල් එක්රැස් කිරීම සඳහා ලබා ගනුයේ පසුදින වැඩ කරන දිනයේදීය.

13.20. බැංකුව වෙත කළයුතු ගෙවීම් චෙක්පත් මගින් බැංකුවේ ශාඛාවක් නොමැති ස්ථානයක සිට කෙරුණු අවස්ථාවකදී ඒ සඳහා බැංකුව විසින් කලින් කලට නිශ්චය කරනු ලබන ක්‍රියාත්මක කිරීමේ හා හැසිරවීමේ ගාස්තුවකට යටත් වේ.

13.21. කාඩ්පත්හිමියා විසින් තම කාඩ්පතේ හිඟව තිබෙන මුදලෙන් සියයට ගණනක් නියමිත දිනයකදී ගෙවීම සඳහා බැංකුවේ ඇති තමාගේ ඉතිරිකිරීමේ හෝ ජංගම ගිණුමට ස්ථාවර නියෝගයක් නිකුත් කළ හැකිය. කාඩ්පත් හිමියා විසින් එවැනි ස්ථාවර නියෝගයක් නැවැත්වීමට හෝ සංශෝධනයන් ඊළඟ ගෙවුම් දිනයට සති දෙකකට ප්‍රථමයෙන් කළ යුතු බව පිළිගනී.

13.22. බැංකුව සමග ඇති ගිණුමක් බේරුම්කරණය සඳහා ලබාදී ඇති සෘජු හැර ස්ථාවර උපදේශයකදී පහත සඳහන් ආකාරයේ නියමයන් හා කොන්දේසිද යෙදෙනු ඇත.

I. කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත පිරිනමන චෙක්පත් හෝ බැංකුව සමග යොදාගෙන ඇති පිළිවෙත්වල ප්‍රමුඛත්වය නිශ්චය කිරීම සඳහා බැංකුවට හිමිකම් ඇති බව කාඩ්පත් හිමියා පිළිගනු ලබයි.

II. නම්කළ ගිණුම බේරුම් කිරීම සඳහා ස්ථාවර උපදෙස් පිළිපැදීමට නම් ගෙවීම් කළ යුතු දිනයට පෙරදින ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් ගිණුමේ තිබිය යුතු බව කාඩ්පත් හිමියා පිළිගනු ලබයි. එසේ තිබිය යුතු ශේෂය ප්‍රමාණවත් නොවූ විට බැංකුව විසින් තම අභිමතයට අනුව කලින් කලට ඒ සඳහා අයිරාවන් නිකුත් කිරීමේ හැකියාවක් ඇත. කරුණු එසේ හෙයින් බැංකුව විසින් කලින් කලට නිර්ණය කරනු ලබන අනුපාතයන්ට අනුව ගෙවිය යුතු මූල්‍ය ගාස්තු, කුලී ගාස්තු යනාදිය හිඟව ඇති ප්‍රමාණයන් සඳහා ගෙවා දැමීමට කාඩ්පත් හිමියා බැඳී සිටී.

III. කාඩ්පත්හිමියා එකඟවනුයේ ප්‍රකාශන දිනයේ සිට ගෙවීමට නියමිත දිනය දක්වා ගෙවා ඇති සියලු අතුරු ගෙවීම් සඳහා බැංකුව වෙත යම් ගිණුම් බේරුම් කිරීම සඳහා ස්ථාවර උපදෙස් ගෙවුම්කරණයේදී සැලකිල්ලට නොගන්නා බවය.

13.23. කාඩ්පත්හිමියා විසින් බැංකුවේ කාඩ්පත් ගිණුමක් සඳහා කරන ලද ගෙවීම් බැංකුව විසින් කලින් කලට සුදුස යැයි සිතා නියමයන් හා කොන්දේසි යටතේ කාඩ්පත් හිමියාගේ වගකීම් ගෙවීම් සඳහා යොදවනු ඇත.

13.24. සාමාන්‍ය ව්‍යාපාර භාවිතයේදී ගෙවීම් ඇත්තේ නම් බැංකුවට ලැබුනු දිනයේ කළා යැයි බැංකුව සලකනු ලබන අතර එයට අදාළ මුදල බැංකුවට තැපෑලෙන් ලැබුනු දිනය ඇත්ත වශයෙන්ම ලැබුනු දිනය වශයෙන් නොසැලකේ. මේ හේතුව මත කාඩ්පත් ගිණුමට බැරවීම සඳහා අවම වශයෙන් දින 3-4ක කාලයක් ලබාදිය යුතුය.

13.25. කාඩ්පත් හිමියා විසින් කරනු ලබන සියලු ගෙවීම් ගෙවිය යුතු මුදල් ඒකකයෙන්ම ගෙවිය යුතුය. ගෙවීමේදී කාඩ්පත් හිමියා විසින් වෙනත් මුදල් ඒකකයක් භාවිතා කළේ නම්, ඊට අදාළ වන සියලු විනිමය, කොමිස් හා අනෙකුත් ගාස්තුද එසේ ගෙවුම් මුදල් ඒකකයට හැරවීමේදී බැංකුවට සිදුවිය හැකි අලාභද කාඩ්පත්හිමියා විසින් දැරිය යුතුවේ. එවැනි විනිමය අනුපාත බැංකුව විසින් කාඩ්පත් ගිණුමට ඇතුල් කිරීමේ දිනයේදී පැවතිය සේ ගණන් බලනු ලැබේ. ගෙවිය යුතු මුදලෙන් කාඩ්පත්හිමියා විසින් කරන ලද ගෙවීම් කාඩ්පත් ගිණුමට මුදල් යොදවන දිනයේදී පමණක් බැරකරනු ඇත. එසේ ගෙවීම වෙනත් මුදල් වර්ගයක් වූ විට එය ගිණුමට බැරකරනු ලබන්නේ ගෙවුම් මුදලට හැරවූ දිනයට පසු දිනයේදීය. එසේ නොවන විට අදාළ මුදල් ප්‍රමාණය බැංකුව ලද දිනයේදී සිදුවේ.

13.26. ගිවිසුමේ අනෙකුත් විධිවිධානයන්ට අගතියක් සිදුනොවන සේ කාඩ්පත්හිමියා මාසයකට වැඩි කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින විට කාඩ්පත්හිමියා විසින් කාඩ්පත් ගිණුම බේරුම් කරන ආකාරය පිළිබඳව පැහැදිලි උපදෙස් ලබාදිය යුතු අතර එසේ පිටත්වීමට ප්‍රථම අදාළ උපදෙස් බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ලබාදිය යුතුවේ. එසේ නොදැන්වූ අවස්ථාවක කාඩ්පත්හිමියාගේ කාඩ්පත අවලංගු කර දැමීමේ අයිතිය තමන්ගේ පූර්ණ අභිමතයට යටත්ව බැංකුව සතුවේ.

13.27. කාඩ්පත්හිමියා විසින් යථාකාලයේදී ගිණුම් ප්‍රකාශය නොලැබීම නියමිත දිනයේදී නොගෙවීමට අදාළ හේතුවක් සේ කාඩ්පත්හිමියා විසින් සැලකිය යුතු

නොවේ. බලාපොරොත්තු නොවූ හේතූන් මත හෝ බැංකුවට පාලනය කළ නොහැකි හේතූන් මත ගිණුම් ප්‍රකාශ නොලැබීම ගැන බැංකුව වගකිවයුතු යැයි සැලකිය නොහැකිය.

13.28. කාඩ්පත්හිමියා තම ප්‍රදේශයෙන් බැහැරව සිටින අවස්ථාවන්හි අවම ගෙවුම් ප්‍රමාණයෙහි ගෙවීම නියමිත දිනයේදී ගෙවීම සඳහා පෙර කටයුතු සූදානම්කිරීම කාඩ්පත්හිමියාගේ වගකීම වේ.

13.29. ආපසු ගෙවීමක් ලද අවස්ථාවක, බැංකුව විසින් අදාළ කාඩ්පත් ගිණුමට එය බැරකරනු ලබන්නේ නියමාකාරයෙන් ආයතනය විසින් බැර වවුචරයක් බැංකුවට ලැබීමෙන් පසුවය.

13.30. කාඩ්පත්හිමියා විසින් බැංකුවට ගෙවිය යුතු ගෙවීමක් (තම ගිණුම් ප්‍රකාශය සම්බන්ධව) අවසාන වශයෙන් ලද සාක්ෂිය වනුයේ කාඩ්පත් ප්‍රකාශයේ එම ප්‍රමාණය ලද බවට ඇති සටහන වේ.

13.31. කාඩ්පත්හිමියා විසින් ගිවිසුමට අනුව බැංකුවට ගෙවිය යුතු සියළු මුදල් ප්‍රමාණ අඩුකිරීමකින් හෝ රැඳවුමකින් තොරව ගෙවිය යුතුවේ. මෙහිදී එසේ අඩුකරගත හැකි ගාස්තු අතර හිලව් කිරීම්, ප්‍රතියාචන බදු හා වෙනත් දේද තිබිය හැක. එසේ වුවද නෛතිකව ගෙවිය යුතු අඩුකිරීම් හෝ රඳවා ගැනීම කෙසේ හෝ සිදුවනු ඇත. අඩුකිරීමක් හෝ රඳවා තබා ගැනීමක් නෛතිකව සිදුකළ යුතු අතර කාඩ්පත්හිමියා විසින් ක්ෂණිකව එය අමතර මුදලක් සේ ගෙවිය යුතු අතර ඉන්පසු එසේ අඩුකිරීමක් හෝ රඳවා ගැනීමක් අවශ්‍ය නොවේ. එසේ අඩුකළ හෝ රඳවා තැබූ මුදල් සඳහා කාඩ්පත් හිමියා විසින් අදාළ බලධාරියාගේ ලදුපතේ ඉදිරිපත් කළ යුතුය.

**වාරික ගෙවීම්.**

කාඩ්පත්හිමියා විසින් භාණ්ඩ හෝ සේවාවන් වාරික මගින් ගෙවීමට තීරණය කළ විට එසේ මිලදීගත් භාණ්ඩ හෝ සේවාවන්හි මුළු අගය කාඩ්පත්හිමියාට ඇති මුළු ණයවර හවුරා තබනු ඇත.

13.32. කාඩ්පත්හිමියා විසින් භාණ්ඩ හෝ සේවාවන් වාරික මගින් ගෙවීමට හෝ ආවරණ ලෙස ගෙවීම් කිරීමට කාඩ්පත භාවිතා කළවිට කාඩ්පත් හිමියා විසින් අදාළ වාරික ගෙවිය යුතුවිට ගෙවීමට බැංකුවට බලය ලබාදෙයි. එමෙන්ම මෙය යටතේ කාඩ්පත්හිමියා විසින් එසේ ගෙවිය යුතු වාරිකයෙන් කාඩ්පත් ගිණුමට බැරකිරීමටද එකඟ වේ.

13.33. කාඩ්පත්හිමියාගේ කාඩ්පත් භාවිතය අත්හිටුවීමට හෝ කාඩ්පත් ගිණුම අවසන් කළ විට බැංකුව විසින් තමන්ගේ විකල්පය මත හා බැංකුවේ අයිතීන්ට හා ප්‍රතිකර්මයන්ට අගතියක් නොවන සේ ගෙවිය යුතු ඉතිරි වාරික සියල්ල කාඩ්හිමියාට පවරා දෙනු ලැබේ.

13.34. කාඩ්පත්හිමියා විසින් වාරික ගෙවීම් ක්‍රමය යටතේ විශේෂිත නියමයන් හා කොන්දේසි බැඳීමට යටත්වීමටද එකඟ වේ. මෙම ඡේදය යටතේ ගැටුමක් සිදුවූ විට විශේෂයෙන්ම එහි විධිවිධානයන් සම්බන්ධයෙන්ද නියමයන් හා කොන්දේසි බැංකුව වෙත හිතකර වෙනු ඇත.

**14. ව්‍යවස්ථාපිත රෙගුලාසි.**

14.1. ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් සමාන මූල්‍ය පාලන ආයතනයන් විසින් වරින් වර ප්‍රකාශයට පත්කරන රෙගුලාසි අනුව කටයුතු කිරීමට කාඩ්පත්හිමියා එකඟ වන අතර කාඩ්පත් භාවිතය සම්බන්ධව එමගින් ඇතිවිය හැකි අලාභ වලින් බැංකුව වෙත දැරිය යුතු අලාභයන්ගෙන් බැංකුව වන්දිපූර්ණය කිරීමටද කාඩ්පත්හිමියා එකඟ වේ.

14.2. මූලධන ගනුදෙනුව වාණිජ්‍ය මට්ටමේ පාරිභෝජක භාණ්ඩ මිලදී ගැනීමට/ආනයනය කිරීමට කාඩ්පත්හිමියා විසින් කාඩ්පත භාවිතා නොකළ යුතුය.

14.3. මෙම කාඩ්පත විද්‍යුත් මුදල් මාරුකිරීම (EFT) හෝ ATM යන්ත්‍රයකින් විදේශ මුදල් ආපසු ගැනීම සඳහා අවශ්‍ය වුවහොත් එවන් කාර්යයන් විටින් විට

විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන රෙගුලාසිවලට යටත්වන අතර එසේ භාවිතා කළ හැක්කේ බලයලත් කරුණු සඳහා පමණි.

14.4. කාඩ්පත්හිමියා විසින් වෙනත් රටකට සංක්‍රමණය වීමේදී, වෙනත් රටකට රැකියාවකට යෑමේදී නැතහොත් නේවාසික නොවන තත්වයට විනිමය පාලන රෙගුලාසි යටතේ තත්වයට පත්වූ විට තම කාඩ්පත් බැංකුවට භාරදිය යුතුය.

14.5. බැංකුව විසින් විනිමය පාලක හෝ කලින් කලට නියම කරනු ලබන වෙනත් ආයතනයන්ට අනුකූලවී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ පවත්නා නීති හා රෙගුලාසි අනුව අදාළ ගනුදෙනු අනාවරණය කරනු ඇත.

14.6. බැංකුව විසින් තමන්ගේ ඒකමතිකත්වය යටතේ පවත්නා විදේශ විනිමය රෙගුලාසි උල්ලංඝනය කර ඇතැයි සැලකෙන කාඩ්පත්හිමියාට දැන්වීමකින් තොරව කාඩ්පත අවලංගු කරනු ඇත.

**15. අයකරවා ගැනීම.**

බැංකුව විසින් විටින් විට දැන්වීමකින් තොරව කාඩ්පතට බැරකළ යුතුව ඇති මාරු කළයුතු මුදල් ප්‍රමාණ හෙවත් කාඩ්පත්හිමියාගේ ගිණුම්වලට බැරකළ යුතු එවැනි මුදල් ප්‍රමාණ හිලව් කරනු ඇත.

**16. කාඩ්පතේ වලංගුභාවය, අවසානය හා අලුත් කිරීම.**

16.1. සියලුම කාඩ්පත් සාමාන්‍යයෙන් නිකුත් කරනු ලබන්නේ එක් අවුරුද්දක වලංගු කාලයකට වේ. බැංකුව තම අභිමතය භාවිතයෙන් වසරකට වැඩි වලංගු කාලයක් ඇති කාඩ්පත්ද නිකුත් කරනු ඇත. කාඩ්පතේ දක්වා ඇති දිනයේදී කාඩ්පතේ වලංගුභාවය අවසන් වනු ඇත.

16.2. නියමයන් හා කොන්දේසි උල්ලංඝනයක් සිදුනොවුවහොත් බැංකුව විසින් ස්වයංක්‍රීයව කාඩ්පතේ වලංගුව අලුත්කරනු ඇත. (එයට අදාළ අමතර කාඩ්පත්ද ඇතුළත් වේ) අලුත් කළ කාඩ්පත සාමාන්‍යයෙන් දින 15 ඇතුළත ලැබෙන අතර එලෙස තමන් වෙත නොලැබුණු කාඩ්පත් හිමියන් ඒ සම්බන්ධව බැංකුවේ කාඩ්පත් සේවාව සමග සම්බන්ධ විය යුතුය.

16.3. සියලුම කාඩ්පත් මාසයකට වැඩි කලක් සඳහා ගෙවීමක් සිදු නොකළයුතු වූ විට එවැනි කාඩ්පත් ස්වයංක්‍රියව අලුත්කරනු ඇත. කාඩ්පත්හිමියෙක් තම කාඩ්පත හෝ අතිරික්ත කාඩ්පත් අලුත්කිරීමක් අවශ්‍ය නොවන්නේ නම් ඒ බව මාස දෙකකට ප්‍රථම කාඩ්පත් සේවයට ලිඛිතව දැන්විය යුතුවේ. මාස දෙකකට ප්‍රථමව හෝ දින 30 කට අවසානයට පසුව ලැබෙන ඉල්ලීම් භාරගනු නොලැබේ. එසේ නොමැති විට අලුත්කිරීමේ ගාස්තුව අයකරනු ලබන අතර එය ආපසු නොගෙවනු ඇත.

16.4. කාඩ්පත්හිමියා විසින් තම කාඩ්පත වලංගු කාලයෙන් පිට භාවිතා කිරීමෙන් වැළකිය යුතුය. එසේ භාවිතා කිරීමට උත්සාහ කිරීමෙන් සිදුවිය හැකි ප්‍රතිවිපාකවලට බැංකුව වගකියනු නොලැබේ.

**17. කාඩ්පත්හිමියන් හා වෙළෙන්ඳන් අතර ආරවුල්**

17.1. කාඩ්පත් හිමියා හා වෙළෙන්දෙක්/වෙළෙඳ ආයතනයක්/මූල්‍ය ආයතනයක් අතර ඇතිවිය හැකි ආරවුලක් හෝ පැමිණිල්ලක් කාඩ්පත් හිමියා විසින් සෘජුවම අදාළ වෙළෙඳ/මූල්‍ය ආයතනය සමග විසඳාගත යුතුය. කාඩ්පත්හිමියා හෝ අතිරේක කාඩ්පත්හිමියාට වෙළඳ/මූල්‍ය ආයතනයෙන් ලැබෙන භාණ්ඩ හෝ සේවාවන්හි තත්වය ගැන කිසිසේත්ම බැංකුව වග කියනු නොලැබේ.

**18. ආරවුල් හා බේරුම්කිරීම.**

18.1. කාඩ්පත්හිමියා විසින් ගිණුම් ප්‍රකාශයේ යම් වරදක් සිදුවී ඇතැයි විශ්වාස කරන විට ඒ සම්බන්ධව ප්‍රකාශයේ දිනයේ සිට දින 30ක් තුළ ඒ සම්බන්ධව බැංකුව දැනුවත් කළ යුතුය. එසේ දැනුම්දීමේදී කාඩ්පත්හිමියා විසින් බැංකුව වෙත පහත සඳහන් තොරතුරු දැන්විය යුතුය. නම හා කාඩ්පත් අංකය, ප්‍රශ්නගත ගනුදෙනුවේ විස්තර මෙන්ම සැක සහිත මුදල් ප්‍රමාණය හා අදාළ වරද.

18.2. කාඩ්පත්හිමියා විසින් වාචිකව දන්වන්නේ නම්, කාඩ්පත්හිමියා විසින් වැඩදින

5ක් ඇතුළත තම පැමිණිල්ල ලිඛිතව දැන්විය යුතුය. අවශ්‍ය වුවහොත් මේ සම්බන්ධව බැංකුව විසින් කාඩ්පත්හිමියාට අමතර තොරතුරු සඳහා අමතනු ඇත.

18.3. බැංකුවේ පරීක්ෂණය අවසන් වන තුරු නැතහොත් නිවැරදි කිරීමක් කරන තෙක් බැංකුව විසින් තමන්ගේ අභිමතය පරිදි අදාළ මුදල් ප්‍රමාණය අදාළ ආරවුල අවසන් වන තුරු කාඩ්පත් ගිණුමට බැරකරනු ඇත. එසේම බැංකුව විසින් තම පරීක්ෂණය අවසානයේ වරදක් සිදුවී නොමැති යැයි තීරණය කළහොත් ඒ බව කාඩ්පත්හිමියාට දන්වනු ඇත. ඒ සමගම හබයට ලක්වූ ප්‍රමාණය කාඩ්පත් ගිණුමට හරකර අදාළ සේවා ගාස්තුවද එයට බැර කරනු ඇත. පරීක්ෂණය අතරවාරයේ බැංකුවට ඊට සම්බන්ධවූ වවුචර පිටපත් ලබාගැනීමට සිදුවුවහොත් ඒ සඳහා යන වියදම් කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

**19. අවසන් කිරීම.**

19.1. ඡේද 13 (ගෙවීම් හා ගාස්තු) යටතේ දක්වා ඇති විධිවිධාන කෙසේ වුවද, කාඩ්පත් ගිණුමක (අතිරේක කාඩ්පත් ඇතුළුව) ගෙවිය යුතු සියලු මුදල්ද කාඩ්පත භාවිතයේදී ගෙවිය යුතු ප්‍රමාණයද මෙම ගිවිසුම අවසන් වීමේදී ගෙවිය යුතු වන්නේය. මෙසේ අවසන් කිරීමක් සිදුවිය හැක්කේ කාඩ්පත් හිමියා විසින් එසේ අවසන්කිරීම සඳහා ලිඛිත දැන්වීමක් කර කාඩ්පත දෙකට කපා එම කොටස් බැංකුවට ඉදිරිපත් කිරීමකදී හෝ කාඩ්පත්හිමියා මියයෑම, වස්තු භංගත්වයට පත්වීම නැතහොත් බැංකුවට කාඩ්පත්හිමියාගේ ආගිය තැන් දැනගැනීමට නොහැකිවීම වේ. කාඩ්පත්හිමියා හෝ ඔහුගේ බූදලය එකී ගෙවිය යුතු මුදල් සම්පූර්ණයෙන් ගෙවා දැමීමට වගකිවයුතුවන අතර හිඟ ගෙවීම් ආපසු ලබා ගැනීමේදී සිදුවන වියහියදම්වලින් බැංකුව වන්දිපූර්ණය වේ. එකී ගෙවීම් සම්පූර්ණ කරන තුරු පොලිය හා වෙනත් ගාස්තු ලබා ගැනීමට බැංකුවට හිමිකම් ඇත.

19.2. ප්‍රාථමික කාඩ්පත්හිමියා තම කාඩ්පත අවසන් කරන අවස්ථාවේදී එකී ප්‍රාථමික කාඩ්පත්හිමියා මෙන්ම අතිරේක කාඩ්පත්හිමියන්ද එක්ව හා වෙන් වෙන්ව සියලු ගෙවිය යුතු මුදල් ගෙවා සියලු කාඩ් දෙකට කපා බැංකුවට ආපසු ලබාදෙන තෙක් පසුපිටේ නියමයන් හා කොන්දේසීන්ට අනුව ගෙවිය යුතු සියලු මුදල් මෙන්ම ගාස්තු සඳහා වගකිව යුතුවේ.

19.3. බැංකුවට හේතුවක් ඇතිව හෝ නොමැතිව පෙර දැනුම්දීමක් කර හෝ නොකර මෙම ගිවිසුම අවසන්කිරීමට හැකියාවක් ඇත. එසේ අවසන්කිරීමක් සිදුකරන තෙක් බැංකුව විසින් නව කාඩ්පතක් (අලුත්කළ) කලින් කලට කාඩ්පත්හිමියන්ට ලබාදෙනු ඇත.

19.4. කාඩ්පත් ගිණුම අවසන් කිරීම හේතුවෙන් වාර්ෂික සාමාජිකත්වයට හෝ ඉන් කොටසක් කාඩ්පත්හිමියාට ගෙවීමට බැංකුව බැඳී නොමැත.

19.5. බැංකුව විසින් යම් සුරැකුමක් කාඩ්පතක් නිකුත් කිරීම වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන්නේ නම්, කාඩ්පත බැංකුවට බාරදී හෝ අවලංගු කිරීමෙන් පසුව අවමයෙන් දින 45ක් දක්වා එකී සුරැකීම ගෙවීමට ඇති මුදල් ගෙවීමේදී පවත්වා ගැනීමට බැංකුවට අයිතියක් ඇත.

19.6. මෙම ගිවිසුම එක් එක් පාර්ශ්වය අවසන් කිරීමෙන් පසුවද කාඩ්පත්හිමියා කාඩ්පත භාවිත කිරීමෙන් ඇතිවිය හැකි සියලු ගෙවීම් සම්පූර්ණ කිරීම සඳහා වගකිවයුතු වේ.

19.7. ඕනෑම හේතුවක් නිසාවෙන් කාඩ්පත්හිමියා මෙම ගිවිසුමේ ඇති නියමයන් හා කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වුවහොත්, බැංකුව විසින් මෙම කාඩ්පත් හිමි ගිවිසුම අවසන් කර එය යටතේ ඇති සියලු ගෙවිය යුතු මුදල් අය කරවා ගැනීමට කටයුතු කරනු ඇත. එවිට බැංකුව විසින් වියදම් දරණ සියලු පිරිවැය හා වියදම් ද නීතිමය ගාස්තුද බැංකුවට ගෙවීමට කාඩ්පත්හිමියා බැඳී සිටී.

**20. වගකීම බැහැර කිරීම.**

පහත සඳහන් ආකාරයේ කාඩ්පත්හිමියාට සිදුවිය හැකි අලාබ හා පාඩු ගෙවා දැමීමට බැංකුව බැඳී නොමැත.

20.1. කාඩ්පත්හිමියා වෙත බැංකුව හෝ වෙළෙන්දෙකු හෝ වෙනත් බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හෝ ATM යන්ත්‍රයක් හෝ වෙනත් පාර්ශවයක් මගින් කාඩ්පත් ගනුදෙනුවක් හෝ තම ණයවර සීමාව දක්වා ලබාදීම මුදල් අත්තිකාරමක් ප්‍රතික්ෂේප කිරීමෙන් සිදුවිය හැකි අලාභයක් හෝ පාඩුවක් ගෙවීමට බැංකුව බැඳී නොමැත.

20.2. ලබාදී ඇති භාණ්ඩ හෝ සේවාවන්හි ඇති අඩුපාඩු වෙනුවෙන් ගෙවීම් සඳහා කාඩ්පත්හිමියාගේ කාඩ්පත් භාරගැනීම හෝ ගරු කිරීම ප්‍රතික්ෂේප කරන වෙළෙන්දෙකු හෝ ආයතනික සාමාජිකයෙකු හෝ එවැනි වෙළෙන්දෙකු විසින් කාඩ්පත් ගනුදෙනුවක් ප්‍රතික්ෂේප කිරීම.

20.3. ATM/POS යන්ත්‍රයක් ක්‍රමවත්ව ක්‍රියා නොකිරීම හෝ සන්නිවේදන ක්‍රියාවලියේ ඇණහිටීම්.

20.4. එවැනි ඉල්ලීම් සහ භාරදීම බැංකුව විසින් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු විසින් හෝ ATM/POS මගින් සිදුකරනු ලැබුවද හෝ එහි සඳහන් වන දිනයට පෙර කාඩ්පත ඉල්ලා ගැනීමට සහ ලබා ගැනීමට ඇති අයිතිය ක්‍රියාත්මක කිරීම.

20.5. ඡේද 19 (අවසන් කිරීම)ට අනුව බැංකුව විසින් කාඩ්පතක් අවසන් කිරීමේ අයිතිය.

20.6. කාඩ්පතේ භුක්තිය වෙනත් පුද්ගලයෙකු විසින් කාඩ්පත භාරගැනීම හෝ ගරු කිරීම ප්‍රතික්ෂේප කිරීම හා ඒ හේතූන් මත කාඩ්පත්හිමියාගේ ණයවර චරිතයට සිදුවන හානි.

20.7. බැංකුව විසින් සිදුකර ඇති විස්තරවල ඇති අවප්‍රකාශ, ව්‍යාජ නියෝජනය, වැරදි, ඡේද 20 හි දක්වා ඇති (බැංකුවේ පොත්, වාර්තා හා පාරිභෝගික තොරතුරු)

20.8. කාඩ්පත්හිමියා හා වෙළෙන්දෙකු හෝ බැංකුව හෝ මූල්‍ය ආයතනයක් හෝ වෙනත් පුද්ගලයෙකු අතර ඇතිවිය හැකි මතභේදයකදී බැංකුව වෙත කාඩ්පත්හිමියාගේ වගකීම එවන් අවස්ථාවන්හි බලනොපාන අතර කාඩ්පත්හිමියාගෙන් කෙරෙන ප්‍රතියාචන වැනි කරුණුවලදීද එය එලෙසම බලනොපානු ඇත.

20.9. තමන්ගේ ව්‍යාපාර දේවක්‍රියා, කැරළි කෝලාහල, ජන කැළඹිලි, විප්ලව, යුද්ධ යනාදියෙන් අතරමග නතරවීම හේතුවෙන් ඇතිවන ප්‍රතිවිපාක හෝ වැඩවර්ජන, අවහිර කිරීම් වැනි පාලනයෙන් තොර අවස්ථා.

**21. ආයතනික කාඩ්පත්හි වගකීම.**

සුදුසුකම් ඇති ආයතනික සංවිධාන මගින් තම කාර්ය මණ්ඩලය, විධායකයන්, අධ්‍යක්ෂවරුන් හෝ වෙනත් පුද්ගලයන් වෙත ලබාදෙන කාඩ්පත් එම ආයතනයේ හා කාඩ්පත්හිමියෝ එක්ව හෝ වෙන්ව අදාළ ආයතන සංවිධාන හා කාඩ්පත්හිමියන් වගකීම් යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

**22. බැංකුවේ පොත්, වාර්තා හා ගනුදෙනුකාර තොරතුරු.**

22.1. බැංකුවේ පොත්, වාර්තා හා ගිණුම් සාරාංශ මෙන්ම බන්ධනය වේ. බැංකුව විසින් නිකුත් කර ඇති ගිණුම් ප්‍රකාශවල සහතික හා මුද්‍රිත අවසන් මෙන්ම ඒකාන්ත ලියකියවිලි වන අතර එවන් දේ කාඩ්පත්හිමියාට විරුද්ධ නිරවද්‍යතාවය සම්බන්ධව අධිකරණයේ නෛතික කටයුතු වලදී ගොනුකළ හැක.

22.2. බැංකුවේ හා කාඩ්පත්හිමියාගේ යහපත හා ආරක්ෂාව සඳහා ඔවුනොවුන් අතර කෙරෙන සියලු දුරකථන ඇමතුම් වාර්තාගත කෙරේ.

22.3. බැංකුව විසින් ඔවුන්ගේ දත්ත, තොරතුරු හා වාර්තා ඉලෙක්ට්‍රොනික්, මයික්‍රොෆිල්ම් හා වෙනත් ක්‍රම (ශ්‍රී ලංකාවෙන් පිටත ඇති දත්ත ගබඩා, පිරිසැකසුම් මධ්‍යස්ථාන) උපයෝගී කර ගනිමින් පවත්වා ගැනීම, සකස්කිරීම හා ගබඩා කළ හැකි බව, කාඩ්පත්හිමියා මෙයින් පිළිගන්නා අතර බැංකුවේ

පණිවුඩ, ෆැක්ස්, ටේප්පටි, පරිගණක මුද්‍රිත මෙන්ම ඔවුන්ගේ ගොනු, පොත්, වාර්තා හෝ ගිණුම් උධෘත අවසාන සාක්ෂියක් සේ සලකා ඉදිරිපත් කළ හැකි බවද පිළිගනී.

22.4. කාඩ්පත්හිමියන් තවදුරටත් පිළිගනු ලබන්නේ බැංකුව විසින් ගිවිසුම්ගත තෙවැනි ගිවිසුම් පාර්ශ්වයකගේ සේවාවන් භාවිතා කළහැකි අතර එවැනි තෙවැනි පාර්ශ්වයන්ට කාඩ්පත්හිමියාගේ හා කාඩ්පත් ගිණුම් තොරතුරු දැනගැනීමට හැකියාවක් ඇති බවය.

22.5. කාඩ්පත්හිමියා විසින් බැංකුව මගින් කරනු ලබන ගනුදෙනුකරුවන්ගේ සම්බන්ධතාවයන්, ගෙවීමට ඉතිරිව ඇති ශේෂ, ගිණුම් වෘත්තාන්ත ඇතුළු තොරතුරු බැංකුවේ ශාඛා මෙන්ම අධිකරණ නියෝගයක් මගින් වෙනත් ආයතන වෙතද එම තොරතුරු ලබාදීම සම්බන්ධව හෙළිදරව් කිරීම්වලට තම එකඟතාවය පළකරන අතර ඇපකරුවන්ටද තෙවැනි පාර්ශ්වයන්ට මෙන්ම බැංකුවේ වෘත්තීයමය උපදේශකයන්ට එවැනි තොරතුරු ලබාදීම ගැනද කාඩ්පත්හිමියා එකඟ වේ. එසේ සිදුකරනු ලබන කාර්යයන් මාර්ගයෙන් කාඩ්පත්හිමියාට සිදුවිය හැකි අලාභ හෝ පාඩු සම්බන්ධව බැංකුවට එරෙහිව ක්‍රියා නොකරන බවටද කාඩ්පත්හිමියා එකඟ වේ.

22.6. කාඩ්පතක් සඳහා අයදුම්කරන්නෙකුගේ ණයවර ස්ථාවරත්වය පරීක්ෂා කිරීමට හෝ එසේ කිරීමේදී අයදුම්කරු දැනුවත් නොකිරීමටද බැංකුවට අයිතියක් ඇත.

22.7. බැංකුව හා/හෝ එහි ඕනෑම නිලධාරීන්/සේවකයන්ට එම බැංකුවේ ගනුදෙනුකරුවෙකුගේ ව්‍යාපාර ගනුදෙනුකරුවන්ගේ තොරතුරු ඕනෑම කාර්යයක් සඳහා එම ගනුදෙනුකරුගේ කාඩ්පත් තොරතුරු (සීමාවන් රහිතව) පහත සඳහන් අයට ලබාදීමට අයිතියක් ඇත.

22.7.1. බැංකුවේ ඕනෑම ශාඛාවක් හෝ වෙනත් හවුල් සාමාජිකයෙකු.

22.7.2. ඕනෑම නියාමක, අධීක්ෂණ, බැංකුව හෝ එහි හවුල් සාමාජිකයෙක් ගැන අධිකරණ බලය ඇති රාජ්‍ය අධිකාරියක්.

22.7.3. අධිකරණ නියෝගයක් මගින් නෛතිකව බැංකුව විසින් හෙළිදරව් කළයුතු යැයි බලාත්මක වී ඇති පුද්ගලයෙකු.

22.7.4. බැංකුවට රහස්‍ය රාජකාරියක් සඳහා එසේ ලබාදිය යුතු පුද්ගලයෙකු.

**23. දුරකථන, ටෙලෙක්ස්, කේබල්, ෆැක්ස් හා ඊමේල් තොරතුරු සඳහා අවසර දීම හා වන්දිපූර්ණය කිරීම.**

23.1. කාඩ්පත්හිමියා විසින් බලය පවරන ලද අයෙකුට ඒ පිළිබඳව නැවත බැංකුව විසින් විමසීමක් නොකොට දැන්වීමක් කළ පමණින් දුරකථන, කේබල්, ෆැක්ස් හෝ ඊමේල් මාර්ගයෙන් එකී තොරතුරු ඉල්ලා සිටින විට බැංකුව විසින් අදාළ තොරතුරු ලබා දෙනු ඇත. එවැනි තොරතුරු ලබාදීමේදී බැංකුව විසින් දෙනු ලබන අදාළ දිනය හා වේලාව තොරතුරු ලබාදුන් වේලාව ලෙස කාඩ්පත්හිමියා විසින් පිළිගනු ඇත.

23.2. මේ ආකාරයට කාඩ්පත්හිමියා බැංකුව ලබාදෙන උපදෙස් පිළිපදිමින් ඒ ගැන කාඩ්පත්හිමියා බන්ධනයට ලක්කිරීමටද බැංකුවට හිමිකම් ඇතිවේ. එමෙන්ම කාඩ්පත්හිමියාගේ උපදෙස් අනුවම ඔහුගේ කාඩ්පත් ගිණුමෙන් බැර හෝ හර කිරීමේදී පැන නැගිය හැකි තත්වයන් මත කාඩ්පත්හිමියා සමග වෙනත් ගිවිසුම් අත්සන් කිරීමටද බැංකුව පියවර ගනු ඇත.

23.3. බැංකුව මෙවැනි බලාත්මක කිරීම්වලදී කාඩ්පත්හිමියා අදාළ සිදුවීම් මාර්ග යෙන් ඇතිවිය හැකි ගනුදෙනුවලදී බැංකුව සම්පූර්ණයෙන් වන්දි පූර්ණය කිරීමට කාඩ්පත්හිමියා බැඳී සිටී. කාඩ්පත් ගිණුමට හරවිය යුතු සියලු ගෙවීම් කාඩ්පත්හිමියා විසින් දැරිය යුතුවේ.

23.4. බලය ලබාදීමේ හා වන්දිපූර්ණය කිරීමේ නියමයන් නැවත වාරයක් වෙනස්

කිරීමට ලක් කරන ලෙස කාඩ්පත්හිමියාගෙන් දැන්වීමක් ලැබෙන තෙක් පවතින අතර කාඩ්පත් ගිණුමට හරකර ඇති සියලු වියදම් කාඩ්පත්හිමියා ගෙවිය යුතුවේ. මේ සම්බන්ධව ඇතිවිය හැකි අවදානම් සම්බන්ධව කාඩ්පත්හිමියා හොඳින් දැනුවත් විය යුතු අතර බැංකුවේ අයිතීන් උල්ලංඝනය වූ විට එය කාඩ්පත්හිමියා විසින් දැරිය යුතුය.

23.5. කාඩ්පත්හිමියා තමන් විසින් ඉහත ආකාරයේ උපදෙස් දුරකථනයෙන්, කේබල්, ෆැක්ස් හෝ ඊමේල් මගින් ලබාදීම ආරක්ෂා විරහිත බව පිළිගනු ලබයි. මෙහිදී ඇතිවන අවදානම කාඩ්පත්හිමියා නිසිලෙස වටහාගෙන ප්‍රකාශකර සිටින්නේ මේ ආකාරයේ උපදෙස් ලබාදීම අවදානම් තිබෙන්නේ වුවද තමන්ට ඉතාමත් පහසුදායක බවය.

**24. හිළව් කිරීමේ අයිතිය හා සුරැකුමක් ලෙස මුදල් ලබාගැනීම.**

24.1. හිළව්කිරීම පිණිස සාමාන්‍යයෙන් ඇති අයිතීන්ට හෝ නීතියෙන් ලබාදී ඇති වෙනත් අයිතීන්ට අමතරව බැංකුවට තමන්ගේ පූර්ණ අභිමතය පරිදි දැන්වීමකින් තොරව කාඩ්පත්හිමියාගේ තනිව හෝ අන් අය සමග ඇති සෑම හෝ යම් ගිණුම් ඒකාබද්ධව කිරීමට බැංකුවට ඇති හැකියාව පිළිගනී. මෙවැනි ඒකාබද්ධ කිරීමකින් පසුව ගිණුම්වලට හර මුදල් එකී ඒකාබද්ධ ගිණුම්වලට ලබාගැනීමට බැංකුව ක්‍රියාකරනු ඇත. එවන් අවස්ථාවන්හි එකී ගිණුම්වලින් හිළව් කිරීමටද කාඩ්පත්හිමියා මෙයින් බලය දෙනු ලැබේ.

24.2. කාඩ්පත්හිමියා ඇතුළු පාර්ශ්වයන්ගේ වගකීම සුරක්ෂිත කිරීම සඳහා නැතහොත් සිතාසි හෝ රීට් ආඥාවක් නිකුත් කළ අවස්ථාවක හෝ කාඩ්පත්හිමියාගේ වස්තු භංගත්වය ඔප්පු කිරීමට අවශ්‍යවූ විට නැතහොත් වෙනත් කරුණක් සඳහා බැංකුව විසින් කාඩ්පත්හිමියා වෙනුවෙන් වෙනත් සුරක්ෂිත ඇපකරයකින් ලැබී ඇති මුදල් කාඩ්පත්හිමියාගේ ගිණුමට බැරකිරීමට කටයුතු කරනු ඇත. එහිදී බැංකුව විසින් බැංකුවෙන් සිදුවිය යුතු බැඳීම් සැලකිල්ලට නොගෙන බැංකුවට ගෙවිය යුතු මුදල් පමණක් ගණන් බලනු ඇත.

24.3. ණය පතක් ලබාදීමට ප්‍රථම අනාගත කාඩ්පත්හිමියෙකුගෙන් බැංකුවේ ඕනෑම ශාඛාවක තැන්පත් ගිණුමක් ආරම්භ කර මුදල් තැන්පත් කරන ලෙස බැංකුව විසින් එම කාඩ්පත්හිමියාට උපදෙස් ලබාදෙනු ඇත. මෙම තැන්පත් ගිණුමේ ඇති මුදල්වලින් ගෙවීමට ඇති මුදල් හිළව් කිරීමේ අයිතිය බැංකුව රඳවා ගනු ඇත. මෙම ගිණුමේ ඇති මුදල් ආපසු ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ ගැන කල්තියා බැංකුව දැනුවත් කළයුතු අතර කාඩ්පත්හිමියාගේ ණය ආපසු ගෙවීමේ රටාව සැලකිල්ලට ගෙන බැංකුව විසින් ඒ සම්බන්ධව තීරණයක් ගනු ඇත. එසේ මුදල් නිදහස් කිරීමට අවමයෙන් වැඩදින 3ක් ගනු ඇත.

**25. දැන්වීම්.**

25.1. කාඩ්පත්හිමියා විසින් තමන්ගේ නමේ, රැකියාවේ, ව්‍යාපාරයේ (කාර්යාලයීය හා/හෝ වාසස්ථානයේ) හා අදාළ දුරකථනවල වෙනසක් සිදුවූ විට ඒ බව ඉතා ඉක්මනින් බැංකුව වෙත දැන්විය යුතුවේ.

25.2. සියලු කාඩ්පත්, රහස්‍ය අංක (PIN), ගිණුම් ප්‍රකාශ, ඉල්ලා සිටීම් හා වෙනත් ලිපි ගනුදෙනු කාඩ්පත් හිමියා වෙත පුද්ගලිකව හෝ කූරියර් සේවා මගින් හෝ අවසන් වරට දන්නා ලිපිනයට සාමාන්‍ය තැපෑලෙන් එවන අතර එය අතින් එවූයේ නම් එම දිනයේම හා කුරියර්/තැපෑල මගින් නම් වැඩකරන දින 3ක් තුළ කාඩ්පත්හිමියාට ලැබුනා යැයි සලකනු ඇත.

25.3. මෙසේ නියමයන් හා කොන්දේසි යටතේ මූලික කාඩ්පත්හිමියාට හා/හෝ අතිරේක කාඩ්පත්හිමියාට යැවූ ලිපි දෙදෙනාටම එව්වා යැයි සැලකේ.

25.4. කාඩ්පත්හිමියා විසින් බැංකුවේ සියලු වාණිජමය තොරතුරු හා එහි භාණ්ඩ හා සේවා පිළිබඳ තොරතුරු ඊමේල්, කෙටිපණිවිඩ (SMS), ෆැක්ස්, තැපැල් හා දුරකථන වැනි මාධ්‍ය මගින් එවීමට බලය ලබාදෙයි.

**26. පොදු.**

26.1. කාඩ්පත්හිමියාගේ උපදෙස් සද්භාවයෙන් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් බැංකුව

එයට වගකිවයුතු නැත.

26.2. කාඩ්පත්හිමියා විසින් තමන්ගේ එවැනි උපදෙස් බැංකුවේ අභිමතය පරිදි සටහන් කර අධිකරණයකදී නීතිමය කටයුතු සඳහා භාවිතා කිරීමට බලය ලබාදේ.

26.3. මෙම ගිවිසුම යටතේ කාඩ්පත්හිමියාගෙන් අයවිය යුතු මුදල් එකතුකර ගැනීම සඳහා නියෝජිතයෙකු පත්කරගැනීමට බැංකුවට හැකියාවක් ඇත.

26.4. මෙම ගිවිසුම යටතේ ඇති ඔවුන්ගේ අයිතිවාසිකම් හෝ බැඳීම් සියල්ල හෝ කොටසක් ඕනෑම අවස්ථාවක දැන්වීමකින් තොරව කාඩ්පත්හිමියා වෙත පැවරීමට හිමිකමක් ඇත.

26.5. කලින් කලට බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් ලේඛනද අත්සන් කිරීමට කාඩ්පත්හිමියා පොරොන්දු වේ.

26.6. මෙහි සපයා ඇති අයිතිවාසිකම් හා ප්‍රතිකර්ම සම්මුචිත වන අතර නීතිය මගින් සපයා ඇති විශේෂිත අයිතිවාසිකම් හා ප්‍රතිකර්ම නොවේ.

26.7. ගිවිසුමේ දක්වා ඇති නියමයන් හා කොන්දේසි කාඩ්පත්හිමියා බැඳ තබන අතර තමාගෙන් ඉටුවිය යුතු බැඳීම් වෙනත් කෙනෙකුට පැවරිය නොහැක.

26.8. බැංකුව ඕනෑම අවස්ථාවක කොන්දේසි විරහිතව හෝ වෙනත් ආකාරයකින් කාඩ්පත්හිමියාගේ මෙම නියමයන් හා කොන්දේසි හෝ කාඩ්පත්හිමියාගේ පැහැරහැරීම් හෝ උල්ලංඝනය කිරීම් අත්හැරදැමිය හැකි අතර මෙම අත්හැරදැමීම් බැංකුව විසින් ලිඛිතව දන්වා සිටීමෙන් පසුව වන අතර එසේ ලබාදෙන අත්හැරීම් එසේ වුවද නෛතිකව බැංකුවේ නෛතිකව ලබාදී ඇති සහන සේ කෙසේවත් නොසැලකෙනු ඇත. මෙසේ කරනු ලබන අත්හැරීම එසේ අත්හැරීම් කළ කර්තව්‍යයට පමණක් සීමා වේ.

26.9. වෙළෙන්ඳන් විසින් ලබාදීමට යෝජිත විශේෂ වට්ටම්/පිරිනැමීම් සම්බන්ධව බැංකුව කිසියම් හෝ වගකීමක් හෝ පොරොන්දුවක් හා සම්බන්ධ නොවේ. මෙය එසේ ලබාදීමට යෝජිත භාණ්ඩ, සේවාවන්හි තත්වය, නිර්මාණය හා බෙදාහැරීම්වලට අදාළ වේ. එසේ ලබාදෙන මෙම භාණ්ඩ මෙම භාණ්ඩ/සේවා සැමවිටම පවත්නා ප්‍රමාණයන්, මුල් ඉල්ලුම්කරුට පළමුව ලබාදීමේ පදනම මත රැඳේ.

26.10. අදාළ වෙළෙන්ඳන් විසින් ලබාදීමට එකඟවන විශේෂ වට්ටම්/පිරිනැමීම් සම්බන්ධයෙන් බැංකුව කිසියම් හෝ වගකීමක් දරණු නොලබයි.

26.11. කාඩ්පත්හිමියාව හමුවීමට නොහැකිවූ විට හෝ බැංකුව විසින් යැවූ ලිපි ආපසු එවීමකදී කාඩ්පත්හිමියාගේ අයදුම්පතේ දක්වා ඇති වෙනත් ලිපිනයකට ඔහුගේ ගිණුම් ප්‍රකාශ හා/හෝ අනෙකුත් ලිපි යැවීමට බැංකුව කටයුතු කරනු ඇත.

26.12. කාඩ්පත්හිමියා විසින් යම් ගනුදෙනුවක් මතභේදයකට ලක්කළ විට අදාළ වියවුල විමර්ශනයකට ලක් කරනු ලැබේ. එසේ වුවද කාඩ්පත්හිමියා විසින් ඒ සම්බන්ධව නීතිමය කටයුතුවල යෙදීමට අපේක්ෂා නොකරන්නේ නම් හෝ බැංකුවට පැමිණි පරීක්ෂණවලට සහාය නොදෙන්නේ නම්, හෝ අදාළ ආරක්ෂිත කැමරා පද්ධති (CCTV) දර්ශන නැරඹීම හා අදාළ වෙළඳසැල හෝ ATM යන්ත්‍රයට පැමිණීමට උනන්දුවක් නොදක්වන්නේ නම් එසේ වූ මතභේදාත්මක ගනුදෙනුවට වගකිවයුතු යැයි සැලකේ.

**27. නියමයන් හි වෙනස්වීම.**

27.1. බැංකුව කලින් කලට මෙම ගිවිසුමේ නියමයන් හා කොන්දේසි වෙනස් කරනු ඇත. ව්‍යවස්ථාවන්හි අවශ්‍යතාවයන්ට යටත්ව එවැනි වෙනස්කම් කාඩ්පත්හිමියාට ලිඛිතව හෝ ප්‍රකාශන මාර්ගයෙන් දැනුවත් කිරීමට බැංකුව කටයුතු කරනු ඇත. එසේ කර ඇති වෙනස්කම් සියලු නොගෙවූ මූල්‍ය ගාස්තු, ගාස්තු මුදල්, මුදල් අත්තිකාරම්, පිරිවැය හා කාඩ්පත් ගනුදෙනු සඳහා යෙදෙනු ඇත.

27.2. මෙම ගිවිසුමේ නියමයන් හා කොන්දේසිවලට කරන ලද වෙනස්කම් ක්‍රියාත්මක කළ දිනයෙන් පසු කාඩ්පත තබාගැනීමෙනුත් භාවිතා කිරීමෙනුත් හැඟී යන්නේ කාඩ්පත්හිමියා විසින් එම වෙනස්කම් නොපිරිහෙලා භාරගෙන ඇති බවය. කාඩ්පත්හිමියා විසින් යෝජිත වෙනස භාර නොගන්නේ නම් කාඩ්පත්හිමියා කාඩ්පත භාවිතය අවසන් කළ යුතු අතර එය ඡේද 19 (අවසන් කිරීම) ක්‍රියාත්මක කෙරෙන දිනයට ප්‍රථම ලිඛිතව දැන්වීමක්ද කළ යුතුය.

**28. ගිවිසුමේ ප්‍රතිවිපාක.**

28.1. මෙම ගිවිසුම අවසන් කළද, මෙහි අඩංගුවන සියලු විධිවිධාන එහි පූර්ණ බලයෙන්ම දිගටම බලපැවැත්වෙන අතර කාඩ්පත්හිමියාට හා අතිරේක කාඩ්පත්හිමියන්ට එරෙහිව ඔවුන් විසින් සිදුකර ඇති කාඩ්පත් ගනුදෙනු හා ඔවුන්ගේ වගකීම් වලදීද පහත සඳහන් ආකාරයට බලපැවැත්වේ.

28.2. නියමයන් හා කොන්දේසි සියල්ලම වෙන්කර වෙන්වෙන්ව ගතහැකි අතර ඒවා එකින් එකට වෙන්ව ගතහැකි අතර ඕනෑම අවස්ථාවක එයින් ඕනෑම නියමයන් හා කොන්දේසි අවලංගු, නීතිවිරෝධී මෙන්ම බලාත්මක කළ නොහැකි අතර එතෙකුදු වුවද අන් නියමයන් හා කොන්දේසි නොවෙනස්ව බලපැවැත්වේ.

**29. කාඩ්පත්හිමියා පිටරට යෑම.**

කාඩ්පත්හිමියෙකු පිටරටකට සංක්‍රමණයවීම හා/හෝ පිටරටකට යෑම හෝ ස්ථිර රැකියාවකට යෑමේදී නැතහොත් පදිංචිය නැතිවීමේදී, විනිමය පාලන රෙගුලාසීන්ට අදාළ නිර්වචනයන්ට අනුව කාඩ්පත්හිමියා විසින් එසේ පිටරට යෑමට මාසයකට පෙර ඒ බවත් හා/හෝ ඔහුගේ පදිංචිය වීසා අවසන් වීමට මසකට පෙර බැංකුව දැනුවත් කළ යුතුය. ඉහත සඳහන් සිදුවීම් දෙකට ප්‍රථම කාඩ්පත්හිමියා ගෙවිය යුතු සියලු මුදල් හා ගාස්තු සම්පූර්ණයෙන්ම ගෙවාදැමිය යුතුය. එමෙන්ම එසේ ගෙවීම් කිරීමෙන් පසු කාඩ්පත් හා අතිරේක කාඩ්පත්හිමියාගේ පිටත්වීමට දින 30ට ප්‍රථම බැංකුවට භාරදිය යුතුය. ඡේද 19 (අවසන්කිරීම) ට අනුව කාඩ්පත්/අතිරේක කාඩ්පත් භාවිතය අවසන් කළා යැයි සැලකේ.

**30. විදේශ ජාතිකයන්ට කාඩ්පත් ලබාදීම.**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති පවත්නා රෙගුලාසි අනුව විදේශ ජාතිකයෙකුට ශ්‍රී ලංකාව ස්ථිරවම හැරයෑමට මාසයකට ප්‍රථම හා/හෝ තම නේවාසික වීසීම ඉකුත් වීමට මාසයකට ප්‍රථම තමන් විසින් ගෙවිය යුතු හිඟව තිබෙන සියලු ශේෂයන් ගෙවා දමා කාඩ්පත් බැංකුවට භාරදිය යුතුය.

**31. විදේශ විනිමය ගනුදෙනු හැරවීමේ ගාස්තු.**

ශ්‍රී ලංකා රුපියල් නොවන විදේශික මුදල් මගින් කර ඇති සියලු කාඩ්පත් ගනුදෙනු ශ්‍රී ලංකා මුදල්වලට හරවා කාඩ්පත් ගිණුමට හරකරන අතර එවිට එදිනට පවත්නා විනිමය අනුපාතයට අනුව මෙම හරකිරීම සිදුවනු ඇත. ඊට අමතරව බැංකුව විසින් මෙසේ විදෙස් මුදල් හැරවීම සඳහා ගාස්තුවක් අයකරන අතර අදාළ කාඩ්පත් ආයතනය විසින් නියමකර ඇති හැරවුම් ගාස්තු ද කාඩ්පත්හිමියාගෙන් බැරකරගනු ලැබේ.

**32. පාලන නීති.**

32.1. ගිවිසුමේ නියමයන් හා කොන්දේසි පාලනය කෙරෙන්නෙත් වටහා ගැනෙන්නෙත් ශ්‍රී ලංකාවේ නීතිය මගිනි. එමෙන්ම කාඩ්පත්හිමියා විසින් ශ්‍රී ලංකා අධිකරණයේ අධිකරණ බලය අවලංගු කළ නොහැකි ආකාරයකට අවනත විය යුතු වන්නේය. එසේ අවනතවීම් කාඩ්පත්හිමියාට එරෙහිව නඩු පැවරීම් සම්බන්ධව ඇති අයිතීන් අගතියට පත්වේ.

32.2. මෙම නියමයන් හා කොන්දේසි, නීතිය, රජයේ රෙගුලාසි හෝ මහ බැංකුවෙන් නිකුත් කෙරෙන උපදෙස් මත ස්වයංක්‍රීයව සංශෝධනය වනු ඇත. කාඩ්පත් ගිණුම නීත්‍යානුකූල හා වලංගු කරුණක් සඳහා පමණක් භාවිතා කළ යුතුය. කාඩ්පත්හිමියා විසින් තුන්වැනි පාර්ශ්වයකට තම කාඩ්පත වෙනත් කටයුත්තක් සඳහා ලබාදුනහොත් එයට කාඩ්පත්හිමියා වගකිවයුතුවන අතර එසේ කළ වියදම් කාඩ්පත්හිමියා විසින් ආපසු බැංකුවට ගෙවිය යුතුය. මෙවැනි අවස්ථාවකදී බැංකුව විසින් මෙම කර්තව්‍යය විනිමය පාලක වෙත දන්වනු ඇත.

32.3. බැංකුවට අදාළ කාඩ්පත බල නොලත් විදේශ විනිමය ගනුදෙනු සඳහා භාවිතා

කරන බවට සැක මතුවුවහොත්, කාඩ්පතට කෙළින්ම පවත්නා විදේශ විනිමය නවත්වා දැමීමට අයිතිය ඇති අතර ඒ බව විනිමය පාලක වෙතද දන්වා යවනු ඇත. එමෙන්ම කාඩ්පත භාවිතා කරමින් කාඩ්පත්හිමියා විසින් කර ඇති විදේශ විනිමය ගනුදෙනු සොයාබැලීමේ අයිතියද බැංකුව රඳවා ගනී.

32.4. කාඩ්පත්හිමියා ශ්‍රී ලංකාව සදහටම හෝ රැකියාවකට හෝ පිටරට ස්ථිර පදිංචියකට යන අවස්ථාවක තමාවෙත නිකුත් කර ඇති කාඩ්පත බැංකුවට භාරදිය යුතුය. කෙසේ වුවද එම කාඩ්පත විදේශ විනිමය මාර්ගයෙන් බේරුම් කළ හැකිවේ. තමන්ගේ NRFC, RFC, RNNFC සහ (Offshore Account) අක්වෙරළ ගිණුම් වෙතොත් ඒ හරහා බේරුම් කළ හැකිය.

32.5 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 1411/5, සඳු දින, 2005 සැප්තැම්බර් 19 හා ඉන්පසු කරන ලද 1789/34, බ්‍රහස්පතින්දා, දෙසැම්බර් 20, 2012 හා 1864/40 බදාදා 2014 මැයි 28 කොටස් 1 වගන්ති (1) සාමාන්‍ය ශ්‍රී ලංකා මහ බැංකු නොතීසි විනිමය පාලන පනත යටතේ නොතීසි (පනතේ 423 පරිච්ඡේදය)

**කොටස් 1 ඃ වගන්ති (1) සාමාන්‍ය**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්**

**විනිමය පාලන පනත යටතේ දැන්වීම**
**(පරිච්ඡේද 423 විනිමය පාලන පනත)**

1. විනිමය පාලන පනතේ (පරිච්ඡේද 423) වගන්ති 7 හා 8 අනුව ශ්‍රී ලංකාවේ වෙසෙන පුද්ගලයෙකුට ශ්‍රී ලංකාවෙන් පිටත වෙසෙන පුද්ගලයෙකුට විදේශ විනිමය මගින් ඉලෙක්ට්‍රොනික් මුදල් හුවමාරු කාඩ්පත් ගෙවීම් කිරීමට පහත සඳහන් නියමයන් හා කොන්දේසි යටතේ ඉඩ සැලසේ.

2. මෙකී EFTC කාඩ්පතක් යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයෙකුට හෝ ආයතනයකට ගෙවීමක් කළ හැකිවනුයේ පහත සඳහන් කරුණු සඳහා වේ.

a. කාඩ්පත්හිමියෙකු විසින් පුද්ගලික තත්වයේ සේවාවන් සඳහා ගෙවීම් උදාහරණ - ගමන්, නවාතැන්, වෛද්‍ය, අධ්‍යාපන වියහියදම්.

b. පුද්ගලික ප්‍රයෝජන සඳහා පිටරටකදී භාණ්ඩ මිලදී ගැනීම.

c. 1969 අංක 01 ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කර ඇති ශ්‍රී ලංකාවට ගෙන්වන පුද්ගලික පරිහරණය සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා ගෙවීම්.

d. විදේශීය වෘත්තියමය ආයතනයක් හෝ ශාස්ත්‍රීය ආයතනයකට පුද්ගලික මට්ටමෙන් ගෙවිය යුතු වාර්ෂික දායකත්වය, විභාග ගාස්තු, ලියාපදිංචි ගාස්තු ගෙවීම.

e. පුද්ගලික ස්වභාවයේ ගමන් හා සෞඛ්‍ය රක්ෂණ සඳහා පමණක් වූ රක්ෂණ වාරික ගෙවීම.

f. ශ්‍රී ලංකාවේ සිටින විට විදේශිය ගමන් හා නවාතැන් සඳහා කළ යුතු ගෙවීම්.

2A. පහත සඳහන් පුද්ගලයන්ට බලයලත් ගනුදෙනුකරුවෙකුගෙන් Debit Card (හරකාඩ්පතක්) ලබා ගැනීම සඳහා සුදුසුකම් ඇත.

a. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු රැකියාවකට හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා විදේශයක සිටින අතරතුර

b. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ස්ථිර පදිංචිය සඳහා විදේශයකට ගොස් Non Resident Blocked Account (NRBA) හෝ Migrant Blocked Account විවෘත කළ විට.

c. රාජ්‍ය තාන්ත්‍රික විදේශීය මුදල් ගිණුම(DFA) හෝ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුමක් (DRA) දරන්නෙකු.

d. Non Resident, Non National Foreign Currency Account (NRNNFA) දරන්නෙකු

e. Resident Guest Rupee Current Account (RGRCA) දරන්නෙකු

f. Senior Foreign National's Rupee Account (SFNRA) දරන්නෙකු

g. Securities Investment Account (SIA) දරන්නෙකු

h. Special Foreign Investment Deposit Account (SFIDA) දරන්නෙකු

i. ජාත්‍යන්තර සේවා සපයන්නන් හා ඔවුන්ගේ සේවා නියුක්තයින් සඳහා (FCAISPE) විදෙස් මුදල් ගිණුමක් ඇති සේවා නියුක්තයින්.

j. විදේශ විනිමය උපයන්නෙකුගේ ගිණුම (FEEA) දරන්නෙකු.

2AA. ඡේද 2 A හි අයිතම (b) සිට (j) යටතේ හර කාඩ්පතක් යම් පුද්ගලයෙකුට නිකුත් කිරීමේදී, එය නිකුත් කරනු ලබන්නේ එවැනි ගිණුමක හර ශේෂයකට අනුවය.

2AB. 2A යටතේ සඳහන් පුද්ගලයන්ට හර කාඩ්පතක් නිකුත් කරනු ලබන්නේ පහත සඳහන් නියමයන් හා කොන්දේසි යටතේය.

(a) ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීමට අවසර ඇත.

(b) ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිව සිටින්නෙකුට අවශ්‍ය ඕනෑම කරුණක් සඳහා එවැනි හර කාඩ්පතක් නිකුත් කරනු ඇත.

(i) රාජ්‍ය තාන්ත්‍රික විදෙස් මුදල් ගිණුම (DFA) ඇති අයෙක්.

(ii) අනේවාසික විජාතික විදෙස් මුදල් ගිණුම් (NRNFA)

(iii) සුරැකුම් ආයෝජන ගිණුම් (SIA) දරන්නෙකු

(iv) විශේෂ අනේවාසික ආයෝජන තැන්පත් ගිණුම් (SFIDA)

(c) පහත සඳහන් පුද්ගලයෙකුට හර කාඩ්පතක් නිකුත් කළ විට, ශ්‍රී ලංකාවෙන් පිට පදිංචි පදිංචිකරුවන්ගේ ජංගම ජාත්‍යන්තර ගනුදෙනු සඳහා.

(i) විදෙස් මුදල් ගිණුමක් (ජාත්‍යන්තර සේවා සපයන්නන්ට හා ඔවුන්ගේ සේවා නියුක්තයින් (FCISPE)ට සේවා නියුක්තිකයෙකු ලෙස

(ii) විදෙස් විනිමය ගිණුමක් ඇත්තෙකුට (FEEA)

(iii) ශ්‍රී ලාංකික පුරවැසියෙකු රැකියාවක් සඳහා හෝ ව්‍යාපාරයක් හෝ වෘත්තියක් සඳහා ගොස් එම රැකියාව හෝ ව්‍යාපාරය ආරම්භ කරන තුරු

3. ශ්‍රී ලාංකීය නේවාසිකයෙකුට EFTC කාඩ්පතක් නිකුත් කළ අවස්ථාවක පිටරටකට සංක්‍රමණය වීමේදී හෝ පිටරට රැකියාවකට යාමේදී එම EFTC භාරදිය යුතුය. එහෙත් එම කාඩ්පත ඡේද 2A හි අයිතම

(a) යටතේ නිකුත් කර ඇත්නම් එසේ භාරදිය යුතු නැත.

3A. හරකාඩ්පත භාවිතයෙන් විදෙස් මුදල් ඒකක ගැනීමට හෝ ණයවරපතකින් මුදල් අත්තිකාරමක් ඉල්ලන විට එම මුදල් ප්‍රමාණය මෙම අවසරය යටතේ අයිතම © 2AB හා ඡේද 2 යටතේ ගනුදෙනුවකට පාවිච්චිකර ඇති බවට සාක්ෂිතිබිය යුතුය."

4. (i) විදේශ මුදලින් කරනු ලබන EFTC ගෙවීමකදී එය ඡේද 2(a) තෙක් පිට කරන ලද්දේ නම් විනිමය පාලකගේ පෙර ලිඛිත අවසරය තිබිය යුතුය. කෙසේ වුවද NRFC ගිණුමකට, RFC ගිණුමකට හෝ RNNFC ගිණුමකට එය බැර කර ඇති විට හෝ අවසරලත් Off Shore ගිණුමකට බැරකර ඇතිවිට අය අවශ්‍ය නොවේ.

(ii) NRFC ගිණුමකින් EFTC හරහා ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිකරුවෙකුට කරන ගෙවීමක් නිදහසේ කිරීමට අවසර ඇත.

5. මෙම දැන්වීමේ අභිප්‍රාය වනුයේ වෙනත් ආකාරයකට සඳහන් නොකළේ නම්,

(i) "බලයලත් වෙළෙන්ඳා" යන්න විනිමය පනතේ දී ඇති තේරුමම වේ.

(ii) "විද්‍යුත් මූල්‍ය මාරු කාඩ්පත" (EFTC) යනු භාවිත කරන්නාට ණය, හර හෝ වෙනත් ආකාරයක ප්‍රමාණ මාරුකිරීම සඳහා සපයා ඇති පහසුකමක් වන අතර ණය කාඩ්පත්, හර කාඩ්පත් හා ගබඩා කර ඇති කාඩ්පත් වන අතර එම ගනුදෙනු විස්තර විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන්ට අනුකූලදැයි බලයලත් වෙළෙන්ඳා විසින් හඳුනාගත හැකිය.

(iii) "හර කාඩ්පත" සෑම විටම මුදල් ආපසු ගැනීමට හෝ මිලට ගත් භාණ්ඩ සඳහා ගෙවීමෙන් කාඩ්පත්හිමියාගේ ණයවර ශේෂයෙන් කෙළින්ම අඩුවනු ඇත. නියමිත දිනයේදී නොගෙවන ප්‍රමාණය සඳහා නිකුත් කරන්නා විසින් පොලියක්ද, වෙනත් ගෙවීමක්ද අයකරනු ඇත.

(iv) "ණය කාඩ්පත" යනු කාඩ්පත් හිමියාට නිකුත් කරන්නා විසින් ප්‍රදානය කර ඇති ණය ප්‍රමාණයක් වන අතර එය නියමිත දිනයකදී ගෙවිය යුතුය.

(v) "පුද්ගලික" යනු කාඩ්පත භාවිතයේදී ඔහුගේ/ඇයගේ කලත්‍රයාටත්, දරුවන් හෝ දෙමාපියන් කිසියම් හෝ වාණිජ කටයුත්තකට එය භාවිත නොකළ යුතුය.

වැඩිදුර තොරතුරු සඳහා අපගේ පාරිභෝගික සේවා
ක්ෂණික ඇමතුම් අංක **1961** (දේශීය) හා
විදේශ ක්ෂණික ඇමතුම් අංකය **+94112031001** හා
**WWW.peoplesbank.lk** අමතන්න.

සංස්කරණය: 1/01/22